# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2026 සැප්තැම්බර් මස 25 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

(2026.09.28 දින නිකුත් කරන ලදී)

## ශ්‍රී ලංකා ක්‍රිකට්

**ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පාලනකරණය, පාලනය කිරීම, නියාමනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් පිහිටුවීම සඳහා ද; යහපාලනය, සුපිළිපන්නභාවය, විනිවිදභාවය, වගකිවයුතුභාවය, ඇතුළත්භාවය සහ සමාන අවස්ථා සැලසීම යන මූලධර්ම හරහා ක්‍රිකට් ක්‍රීඩාවේ වර්ධනය අභිවර්ධනය කිරීම සඳහා ද; සියලු සහභාගීවන්නන්ගේ සුභසාධනය ආරක්ෂා කිරීම සහ දූෂණයෙන් සහ වෙනත් අනිසි ක්‍රියාකාරකම්වලින් ක්‍රිකට් ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා ක්‍රිකට් සංස්ථාපනය කිරීම, බලතල සහ කර්තව්‍ය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ වූ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 275.00** | **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.- ඕ. 29/2026

**ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පාලනකරණය, පාලනය කිරීම, නියාමනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් පිහිටුවීම සඳහා ද; යහපාලනය, සුපිළිපන්නභාවය, විනිවිදභාවය, වගකිවයුතුභාවය, ඇතුළත්භාවය සහ සමාන අවස්ථා සැලසීම යන මූලධර්ම හරහා ක්‍රිකට් ක්‍රීඩාවේ වර්ධනය අභිවර්ධනය කිරීම සඳහා ද; සියලු සහභාගීවන්නන්ගේ සුභසාධනය ආරක්ෂා කිරීම සහ දූෂණයෙන් සහ වෙනත් අනිසි ක්‍රියාකාරකම්වලින් ක්‍රිකට් ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා ක්‍රිකට් සංස්ථාපනය කිරීම, බලතල සහ කර්තව්‍ය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ වූ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක දරන ශ්‍රී ලංකා ක්‍රිකට් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## ශ්‍රී ලංකා ක්‍රිකට් පිහිටුවීම

ශ්‍රී ලංකා ක්‍රිකට් පිහිටුවීම

**2.** (1) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයන් වර්ග යටතේ 29 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ලියාපදිංචි විය හැකි සාමාජිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත වන ශ්‍රී ලංකා ක්‍රිකට් යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු සහ හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව නියාමනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වගකිවයුතු වන පරම අධිකාරිය විය යුතු ය.

PL 15951 - 465 (2026/09)

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්, (1) වන උපවගන්තිය මඟින් ඊට ලබා දී ඇති නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි පරමාර්ථ

**3.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි පරමාර්ථ වනුයේ-

(අ) (මෙහි මින් මතු ‘‘අයිසීසී’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර ක්‍රිකට් සභාවේ, (මෙහි මින් මතු ‘‘ඒසීසී’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ආසියානු ක්‍රිකට් සභාවේ, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සාමාජිකයකු බවට පත් වන හෝ අනුබද්ධ ආයතනයක් බවට පත් වන වෙනත් යම් සංගමයක, සාමාජිකත්ව බැඳියාවන්, පාලන නියම සහ තීරණ මෙන් ම ශ්‍රී ලංකා ක්‍රිකට්වලට අදාළ වන තාක් දුරට සහ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට ක්‍රිකට් නීති බලාත්මක කිරීම සහ ඒවාට අනුගත වීම;

(ආ) ජාත්‍යන්තර මට්ටම, ජාතික මට්ටම, පළාත් මට්ටම, දිස්ත්‍රික් මට්ටම, පාසල් මට්ටම සහ රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි විවිධ වර්ගයේ පුද්ගලයන්, ආයතන හෝ මණ්ඩල විසින් ක්‍රීඩා කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ක්‍රීඩා කරන සියලු ම මට්ටම් පාලනකරණය, පාලනය කිරීම, නියාමනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම;

(ඇ) ක්‍රීඩකයන්, ක්‍රීඩා සමාජ, පාසල්, සංගම්, නිලධරයන් සහ ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධිත වෙනත් සියලු පාර්ශ්වයන් විසින් ක්‍රිකට් ක්‍රීඩාවට සහභාගි වීම අභිවර්ධනය කිරීම, දිරිගැන්වීම සහ පහසුකම් සැපයීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව, පරිපාලනය කිරීම සහ මෙහෙයවීම සම්බන්ධයෙන් වන ක්‍රීඩා කිරීමේ

කොන්දේසි, ප්‍රතිපත්තීන්, මාර්ගෝපදේශ සහ පාලනය කිරීමේ ප්‍රමිතීන්වලට අදාළ මේ පනතේ විධිවිධාන සහ එය යටතේ සාදන ලද රීති ක්‍රියාත්මක කිරීම, බලගැන්වීම, ඒවාට අනුකූලව කටයුතු කිරීම සහ ඒවා බලාත්මක කිරීම;

(ඉ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් සඳහා ඒකාකාර පාලන ප්‍රමිතීන් ස්ථාපිත කිරීම;

(ඊ) තහනම් උත්තේජක, දූෂණය, වෙනස්කොට සැලකීම, හිංසනය, වයස පිළිබඳ වංචාවන් සිදුකිරීම සහ වෙනත් සියලු සදාචාර විරෝධී හෝ අසාධාරණ පරිචයන් වැළැක්වීම ඇතුළුව ක්‍රිකට් ක්‍රීඩාවේ සහ එයට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ යහපත, සුභසාධනය, සුපිළිපන්භාවය, වෘත්තීයභාවය සහ ආචාරධර්ම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම; සහ

(උ) ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය සහ ප්‍රවේශ්‍යතාවය සඳහා සහ ශ්‍රී ලංකාව පුරාවට සිටින ප්‍රජාවේ සුභසාධනය සහ සංවර්ධනය සඳහා දායක වීමට ආයතනික සමාජ වගකීම, පුණ්‍යාධාර, අධ්‍යාපනික, සංස්කෘතික, පාරිසරික, සමානාත්මතාවය, විවිධත්වය සහ සමාජ සුභසාධන මූලාරම්භකයන් භාර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම,

වේ.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි බලතල, කාර්ය සහ කර්තව්‍යය

4. (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) සෑම වර්ෂයක ම මුල් මාස හය ඇතුළත වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම;

(ආ) අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවල දී විශේෂ මහා සභා රැස්වීම් පැවැත්වීම;

(ඇ) අයිසීසී, ඒසීසී සමග සහ ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සාමාජිකයකු බවට පත්වන හෝ අනුබද්ධ ආයතනයක් බවට පත් වන වෙනත් යම් සංගමයක් සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට්හි අනුබද්ධතාව ලබා ගැනීම, පවත්වාගෙන යාම, අලුත් කිරීම හෝ අන්‍යාකාරයෙන් තබා ගැනීම;

(ඈ) ක්‍රිකට් ක්‍රීඩාවේ ස්වාධීන පාලනය, සුපිළිපන්නභාවය, පරිපාලනය සහ නියාමනය සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ක්‍රිකට්හි තත්ත්වයට, අයිතිවාසිකම්වලට, බැඳියාවන්ට හෝ අයිසීසී හෝ ඒසීසී සමඟ වන අඛණ්ඩ අනුබද්ධතාවයට අගතිදායක විය හැකි, ඒවා යටපත් කළ හැකි, අනතුරේ හෙළිය හැකි හෝ ඒවාට අහිතකර ලෙස බලපෑ හැකි යම් ක්‍රියාවක, නොකර හැරීමක, පරිචයක හෝ හැසිරීමක යෙදීමෙන් වැළකීම;

(ඉ) දේශීය සහ ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලි, ලීග්, ක්‍රිකට් තරඟ, තරඟ, සංචාර සහ ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාවේ පිළිගත් සියලු ආකාරයන්ගේ අදාළ උත්සව සංවිධානය කිරීම, ඒවාට අවසර ලබා දීම, මෙහෙයවීම, නියාමනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඊ) පුහුණුව ලබා දීම, විනිශ්චය කිරීම, තරඟ මෙහෙයවීම, අධ්‍යාපනය ලබා දීම, පුහුණු කිරීම් සිදුකිරීම සහ විභාග, ශ්‍රේණිගත කිරීමේ පද්ධති, ඉහළ කාර්ය සාධන වැඩසටහන් සහ වෙනත් තාක්ෂණික හා සංවර්ධන මූලාරම්භකයන් හඳුන්වාදීම මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය සංවර්ධනය කර වැඩි දියුණු කිරීම;

(උ) අයිසීසී, ඒසීසී සමඟ ඇති සාමාජිකත්වය සහ අනුබද්ධතාවය සහ ශ්‍රී ලංකා ක්‍රිකට්වල යහපතට අවශ්‍ය වන බවට හෝ වැඩදායී වන බවට සලකනු ලැබිය හැකි වෙනත් යම් ජාත්‍යන්තර ක්‍රිකට් හෝ

ක්‍රීඩා මණ්ඩල සමඟ ඇති සාමාජිකත්වය සහ අනුබද්ධතාවය ඇතුළුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ජාත්‍යන්තර වශයෙන් නියෝජනය කිරීම;

(ඌ) ක්‍රීඩා යටිතල පහසුකම්, අධ්‍යාපන, ඉහළ කාර්ය සාධන මධ්‍යස්ථාන, ක්‍රීඩා සංචාරක මූලාරම්භකයන්, ඒකාබද්ධ ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘති සහ ක්‍රීඩා නගර සංකල්ප ඇතුළුව ක්‍රිකට් ක්‍රීඩාවේ සහ ක්‍රීඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම්වල තිරසාර සංවර්ධනය, වාණිජ දියුණුව සහ ව්‍යාප්තිය සඳහා ව්‍යාපෘති, ව්‍යාපාර සහ මූලාරම්භකයන් භාර ගැනීම, ක්‍රියාවට නැංවීම සහ ප්‍රවර්ධනය කිරීම;

(එ) ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ භාරකරු සහ භාරකාරත්වය දරන්නා වශයෙන් අධිකාරය සහ වගකීම දැරීම;

(ඒ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් වර්ග ලියාපදිංචි කිරීම 31 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවීම, ඉවත් කිරීම හෝ අන්‍යාකාරයෙන් අවසන් කිරීම;

(ඔ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්යය සඳහා, යම් චංචල හෝ නිශ්චල දේපළක් හෝ ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම, දැරීම සහ කළමනාකරණය කිරීම හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් මිලදී ගන්නා ලද හෝ දරන ලද යම් චංචල හෝ නිශ්චල දේපළක් හෝ ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය වත්කම් බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම සහ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ඒ මතින් වන යම් අයිතිවාසිකම් සහ වරප්‍රසාද ප්‍රදානය කිරීම;

(ඕ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව සිටින තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින්

මුදලින් හෝ අන්‍යාකාරයෙන් වන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග පිළිගැනීම සහ භාරයක් භාරගැනීම සහ ඒවා මේ පනත යටතේ එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී යොදා ගැනීම සහ පුණ්‍ය අරමුණු සඳහා ත්‍යාග සිදු කිරීම;

(ක) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්ය සඳහා, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසි මත, ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ණයට ලබා ගැනීම සහ ඒ මුදල් පියවීම සහතික කිරීම;

(ග) ශ්‍රී ලංකා ක්‍රිකට්හි විවිධ සාමාජිකයන් වර්ගවලින් සාමාජිකත්ව ගාස්තුව සහ වාර්ෂික දායක මුදල් අයකිරීම සහ රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් පවත්වනු ලබන හෝ සංවිධානය කරනු ලබන ක්‍රිකට් තරඟ, තරඟාවලි, ඉසව් සහ වැඩසටහන්, සම්බන්ධයෙන් ප්‍රවේශපත්‍ර සඳහා වන ගාස්තුව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සපයනු ලබන පහසුකම් හෝ සේවාවන් සම්බන්ධයෙන් වන ගාස්තු අයකර ගැනීම;

(ච) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අරමුදල් මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ජ) 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ශ්‍රී ලංකා ක්‍රිකට් නාමයෙන් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ව්‍යවහාර මුදලකින් ජංගම, ඉතුරුම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම;

(ට) සෘජුව හෝ මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය ලබා දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු හරහා ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සියලු යම් එකඟතා, ගිවිසුම් හෝ ආයෝජන, බද්ධ ව්‍යාපාර, උපායමාර්ගික හවුල්කාරීත්වය, සහන, රාජ්‍ය- පෞද්ගලික හවුල් ව්‍යාපාර, ඉදිකිරීම් -

මෙහෙයුම් - පැවරීමේ විධිවිධාන සහ වෙනත් වාණිජ, සංවර්ධන හෝ මෙහෙයුම් වැඩපිළිවෙළවල් සඳහා එළඹීම සහ ඒවා කිරීම හෝ කරගෙන යාම;

(ඩ) ක්‍රිකට් ක්‍රීඩාව හෝ ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධ කටයුතු සංවර්ධනය, ප්‍රවර්ධනය, පරිපාලනය, සංවිධානය හෝ හැසිරවීම සඳහා අවශ්‍ය විය හැකි යම් අනුමතයක්, බලපත්‍රයක්, කැමැත්තක්, වෙන් කිරීමක්, පහසුකමක්, ප්‍රවේශයක් හෝ නිදහස් කිරීමක් ඇතුළුව යම් අයිතිවාසිකම්, වරප්‍රසාද සහ සහන යම් විදේශීය ආණ්ඩුවලින් හෝ යම් විදේශීය ආයතනයකින් හෝ ආණ්ඩුවේ යම් අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් සභාවකින්, පළාත් පාලන ආයතනයකින් හෝ රාජ්‍ය සංස්ථාවකින් ලබා ගැනීම;

(ණ) යම් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සංවර්ධනය කිරීම, ඒවාට ඉල්ලුම් කිරීම, මිලදී ගැනීම හෝ අන්‍යාකාරයෙන් අත්කර ගැනීම සහ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසි මත එකී බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන බලපත්‍ර භාවිත කිරීම, ප්‍රයෝජනයට ගැනීම, ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය කිරීම හෝ ප්‍රදානය කිරීම;

(ත) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ක්‍රීඩා කිරීම සඳහා භාවිත කරනු ලබන කවර ආකාරයේ හෝ ක්‍රීඩා කිරීමේ පෘෂ්ඨ සඳහා නවීන තණතිලි කළමනාකරණය කිරීම යොදා ගැනීම දිරිගැන්වීම සහ ප්‍රවර්ධනයය කිරීම;

(ද) VI වන කොටසේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්ය මණ්ඩලයට නිලධරයන් සහ සේවා නියුක්තයන්, අනුශාසකයන්, උපදේශකයන් සහ වෙනත් සේවක පිරිස් සේවානියුක්ත කිරීම;

(න) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්, යම් ක්‍රීඩකයකු, තරඟ නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තෙකු සමඟ සුදුසු ගිවිසුම්ගත විධිවිධාන හරහා මූල්‍ය සම්බාධක පැනවීම;

(ප) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ තිරසාර වර්ධනය සහ අභිවර්ධනය සහතික කිරීමේ අදහස ඇතිව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි සියලු සාමාජිකයන්ට සහ ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධිත වෙනත් පාර්ශ්වයන්ට පහසුකම්, යටිතල පහසුකම් සහ සහාය සැපයීම;

(බ) 21 වන වගන්තිය යටතේ කමිටු සහ අනුකමිටු යම් සංඛ්‍යාවක් පත්කිරීම;

(ම) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී ඡන්දය ලබා දීම හැර, අමාත්‍යවරයාගේ අවසරය ඇතිව යම් පළාත් ක්‍රිකට් සංගමයක පරිපාලන කර්තව්‍ය සියල්ල හෝ කිසිවක් තාවකාලිකව භාරගෙන ක්‍රියාත්මක කිරීම; සහ

(ය) සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට යෝග්‍ය වන හෝ ආනුෂංගික විය හැකි සියලු වෙනත් යම් ක්‍රියාවන් සහ දෑ සිදුකිරීම.

(2) ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත පිරිනමන ලද, පවරන ලද හෝ පනවන ලද, බලතල, කාර්ය සහ කර්තව්‍ය සද්භාවයෙන් යුතුව සහ ක්‍රිකට් ක්‍රීඩාවේ, ඊට සහභාගීවන්නන්ගේ සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ උපරිම යහපත සඳහා සහ සුපිළිපන්නභාවය, වගකිවයුතුභාවය, විනිවිදභාවය, අන්තර්කරණය සහ මහජන භාරය යන මූලධර්මවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ පාලනකරණය

**5.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ පාලනකරණය (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරා දෙනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවීම

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනත යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත පිරිනමන ලද, පවරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) 22 වන වගන්තිය යටතේ පිහිටුවන ලද නාමයෝජනා කමිටුව විසින් (4) වන උපවගන්තියට යටත්ව නම් කරනු ලැබිය යුතු සහ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන ස්වාධීන අධ්‍යක්ෂවරයන්:-

(i) 1959 අංක 23 දරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකත්ව කාලසීමාව අවුරුදු පහළොවකට නොඅඩු, එම ආයතනයේ සාමාජිකයකු විය යුතු, වරලත් ගණකාධිකාරිවරයකු;

(ii) අවම අවුරුදු පහළොවක ශ්‍රී ලංකාව තුළ සක්‍රීය නීති වෘත්තියෙහි යෙදී ඇති නීතිඥවරයකු;

(iii) පත් කරනු ලබන දිනට පෙරාතුව වූ මාස තිස්හයක කාලසීමාවට පෙර යම් ඕනෑම කාලයක දී ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ පහළොවකට නොඅඩු ක්‍රිකට් තරඟ ක්‍රීඩා කර ඇති මනා කීර්ති නාමයක් ඇති හිටපු ක්‍රිකට් ක්‍රීඩකයකු;

(iv) පුළුල් ආයතනික පළපුරුද්ද සමඟ පරිගණක විද්‍යාව හෝ තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකමක් සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයකු;

(v) අලෙවිකරණය හෝ ගෝලීය සන්නාම කළමනාකරණය හෝ සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයන්හි පිළිගත් සුදුසුකමක් සහිත සහ සැලකිය යුතු ජාතික හෝ ජාත්‍යන්තර වෙළඳපොළ පැවැත්මක් ඇති සන්නාම සංවර්ධනය, කළමනාකරණය, වාණිජකරණය සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ පළපුරුද්ද ඇතුළුව අලෙවිකරණ ක්ෂේත්‍රයේ ඔප්පු කළ හැකි වාර්තාවක් සහිත තැනැත්තකු; සහ

(vi) යම් රාජ්‍ය සංස්ථාවක හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද යම් සමාගමක හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද යම් සංවිධානයක ප්‍රධාන විධායක නිලධාරීවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු වැනි ජ්‍යෙෂ්ඨ විධායක හෝ නායකත්ව තනතුරු හෝ සමාන තනතුරක සේවය කර ඇති හෝ සේවය කරනු ලබන තැනැත්තන් ඇතුළුව, නොකැළැල් කීර්ති නාමයක් සහිත, ගිණුම්කරණය, මූල්‍යය, කළමනාකරණය, නීතිය, තොරතුරු තාක්ෂණය, අලෙවිකරණය, ක්‍රීඩා හෝ පාලන යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ විශේෂභාවය සහිත වෙනත් තැනැත්තන් දෙදෙනකු; සහ

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි මහා සභා රැස්වීම්වල ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම ඇති, ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් විසින් තෝරා පත් කර ගන්නා ලද, තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරු හත්දෙනකු.

(4) (3) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ සඳහන් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් යටත් පිරිසෙයින් දෙදෙනකු වත් කාන්තාවන් විය යුතු ය.

(5) පළමුවන මණ්ඩලය, 9 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් සහ කාලසීමාව තුළ පත්කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා

**6.** (1) මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරු අතරින්, මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරු අතරින් නියෝජ්‍ය සභාපතිවරයා, තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාට, රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, නියෝජ්‍ය සභාපතිවරයා විසින් නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් ඔහුගේ සාමාන්‍ය කාර්යවලට අමතරව සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු ය. සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත, ඔවුන්ගේ ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයකු, එකී ස්වාධීන අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහුගේ සාමාන්‍ය කාර්යවලට අමතරව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා නොමැති විට මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයා විසින් අයිසීසී, ඒසීසී හෝ යම් අනුබද්ධ සංසදයක යම් රැස්වීමක දී, මණ්ඩලය නියෝජනය කරනු ලැබිය යුතු අතර ඔවුන් නොමැති අවස්ථාවක, ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් බලය ලබා දෙන ලද යම් වෙනත් ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් එවැනි යම් රැස්වීමක දී මණ්ඩලය නියෝජනය කරනු ලැබිය යුතු ය.

**7.** යම් තැනැත්තකු -

මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර ගැනීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයකු හෝ සේවානියුක්තයකු, 22 වන වගන්තියේ සඳහන් කරනු ලබන නාමයෝජනා කමිටුවේ සාමාජිකයකු හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකුගේ යම් ධුර දරන්නකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඇ) සිහි විකල තැනැත්තකු බව හෝ ඔහුගේ කාර්ය ඉටු කර ගැනීමට නොහැකි බව නිසි අධිකරණයක් විසින් තීන්දු කර ඇත්තේ නම් හෝ ඇති නම්;

(ඈ) වස්තුභංගත්ව තැනැත්තකු බවට නිසි අධිකරණයක් විසින් තීන්දු කර ඇත්තේ නම් හෝ ඇති නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ ලිඛිත නීති යටතේ වරදකරු කිරීම සම්බන්ධයෙන් වන යම් අභියාචනයක් විභාග වෙමින් පැවතීම නොතකා, නාමයෝජනා කිරීමේ, පත් කිරීමේ හෝ තෝරා පත් කර ගැනීමේ දිනයට පෙරාතුව ම වන අවුරුදු දහයක කාලසීමාව තුළ, ඒ දණ්ඩනය අත්හිටවනු ලැබූව ද, නොවූව ද, චරිත දූෂණය, වංචාව, වංකභාවය, දූෂණය හෝ හිංසනය සම්බන්ධයෙන් වන යම් වරදක් සඳහා යම් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් හෝ යුද්ධ විනිශ්චයාධිකරණයක් විසින් වරදකරු කර මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමක් සඳහා දඬුවම් පමුණුවා ඇත්තේ නම් හෝ ඇති නම්;

(ඊ) විනය පදනම් මත, විෂමාචාර සඳහා හෝ රාජකාරී කඩ කිරීම හෝ මේ පනතේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් නුසුදුසුකමක් මත ශ්‍රී ලංකා ක්‍රිකට්හි හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජික වර්ගයක දරන

ලද යම් ධුරයකින් පූර්වයෙන් ඉවත් කර ඇත්නම් හෝ යම් ධුරය හිස් කිරීමට පූර්වයෙන් නියම කර ඇති නම්;

(උ) නාමයෝජනා භාරදීමට පෙරාතුව ම වන අවුරුදු තුනක කාලසීමාව තුළ විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයේ ගෙවීම් කරනු ලබන සේවානියුක්තයකු හෝ නිදහස් ජනමාධ්‍යවේදියකු ලෙස යම් මාධ්‍ය සංවිධානයකට සම්බන්ධ වෘත්තීය ජනමාධ්‍යවේදියකු ලෙස කටයුතු කරනු ලබන්නේ නම් හෝ ලැබුවේ නම් හෝ මාධ්‍ය සංවිධානයක හිමිකරුවකු හෝ අර්ථලාභී හිමිකරුවකු හෝ ප්‍රධාන කොටස් හිමියකු වන්නේ නම්;

(ඌ) යම් ජාතික සංචිතයක හෝ යම් ජාතික කණ්ඩායමක ක්‍රිකට් ක්‍රීඩකයකුගේ දෙමාපියකු නැතහොත් සහෝදරයකු වන්නේ නම්;

(එ) නාමයෝජනා භාරදීමට පෙරාතුව ම වන අවුරුදු තුනක කාලසීමාව තුළ, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් පවත්වන ලද හෝ බලය ලබාදෙන ලද යම් ක්‍රිකට් තරඟාවලියකට සහභාගි වෙමින්, ක්‍රිකට් ක්‍රීඩාවේ තරඟ නිලධරයකු හෝ එක් තරඟකරුවකුගේ හෝ කණ්ඩායමක පුහුණුකරුවකු ලෙස කටයුතු කර ඇති නම්;

(ඒ) ක්‍රිකට් ක්‍රීඩකයකුගේ නියෝජිතයකු හෝ කළමනාකරුවකු වන්නේ නම්;

(ඔ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වීම නතර කර ඇති නම්;

(ඕ) නාමයෝජනා භාරදීමට පෙරාතුව ම වන අවුරුද්ද තුළ, ශ්‍රී ලංකාවට ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ යම් අයිතමයක් හෝ උපකරණයක් විකිණීමෙහි හෝ සැපයීමෙහි යෙදෙන්නේ නම් හෝ යෙදී ඇති නම් හෝ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ ක්‍රීඩා

පුහුණු පාසල් පවත්වනු ලබන්නේ නම් හෝ පවත්වනු ලැබ ඇති නම් හෝ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ මූල්‍ය සේවාවන් සැපයීමෙහි යෙදී සිටින්නේ නම්;

(ක) ඔහුට හෝ ඔහුගේ පවුලේ යම් ආසන්න සාමාජිකයකුට (කලත්‍රයා, දෙමාපියන්, සහෝදරයකු, පුත්‍රයකු, දියණියක හෝ බෑනා හෝ ලේලිය වන) ඔට්ටු ඇල්ලීම, සූදු හෝ පරදු තැබීම සම්බන්ධයෙන් බැඳියාවක් ඇත්නම් හෝ ඔට්ටු ඇල්ලීමේ, සූදු හෝ පරදු තැබීමේ සංවිධානයක බැඳියාවක් ඇති නම් හෝ එවැනි යම් සංවිධානයක දෛනික මෙහෙයුම්වල සේවා නියුක්ත වන්නේ නම්;

(ග) ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් වන කටයුත්තක් සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව හෝ එකඟතාවය ඇතිව, ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වක දී රට නියෝජනය කර ශ්‍රී ලංකාවට ආපසු නොපැමිණි තැනැත්තකු වන්නේ නම් හෝ එවැනි තැනැත්තකු ව සිට ඇති නම්;

(ච) ශ්‍රී ලංකා ක්‍රිකට්හි හෝ ක්‍රීඩා පනත යටතේ පිහිටුවන ලද වෙනත් යම් ජාතික ක්‍රීඩා සංගමයක හෝ යම් සාමාජික ක්‍රීඩා සමාජයක හෝ සංගමයක සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික හෝ උපභාණ්ඩාගාරික යන ධුර එකවර දරන තැනැත්තකු වන්නේ නම්; හෝ

(ජ) තහනම් උත්තේජක භාවිතය, දූෂණය, ඔට්ටු ඇල්ලීම, තරඟ පාවාදීම, තරඟයේ නිශ්චිත අවස්ථා පාවාදීම හෝ අභ්‍යන්තර තොරතුරු අවභාවිතය සම්බන්ධයෙන් වන යම් වරදකට අදාළව -

(i) 21 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා ක්‍රිකට්හි විනය සහ ආරාවුල් කමිටුව විසින්;

(ii) 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 10 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්;

(iii) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්; හෝ

(iv) අයිසීසී, ඒසීසී හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් සමඟ අනුබද්ධිත ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධිත හෝ අදාළ යම් සංගමයක තීරණ ගැනීමේ අධිකාරය විසින්,

පනවන ලද යම් දණ්ඩනයකට, තහනමකට, අත්හිටුවීමකට, තහනම් කිරීමකට හෝ නුසුදුසුකමකට යටත්ව සිට ඇති නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ තෝරා පත් කර ගනු ලැබීම සඳහා හෝ ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂකවරයකු ලෙස තවදුරටත් කටයුතු කරනු ලැබීම සඳහා නුසුදුස්සකු වන්නේ ය.

මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරු සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරු පත් කිරීම

**8.** (1) 22 වන වගන්තියේ සඳහන් කරනු ලබන නාමයෝජනා කමිටුව විසින්, මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබිය යුතු ය.

(2) ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම සඳහා 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ සුදුසුකම්ලත් යම් තැනැත්තකු විසින්, ඉල්ලුම්පත් කැඳවනු ලබන දින සිට දින දහහතරක කාලයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලුම්පතක් යොමු කරනු ලැබිය හැකි ය.

(3) යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක, නාමයෝජනා කමිටුව විසින්, එකී යම් තනතුර පුරප්පාඩු වීමෙන් දින තිහක් ඇතුළත නාමයෝජනා කමිටුවේ නාමයෝජනා ඉදිරිපත් කළ යුතු ය.

(4) නාමයෝජනා කමිටුව විසින්, ස්වාධීන අධ්‍යක්ෂවරු ලෙස පත් කිරීම සඳහා නම් කළ යුතු තැනැත්තන් සලකා බැලීම සඳහා වන ඉල්ලුම්පත් රීති මඟින් නිශ්චිතව දැක්විය හැකි ආකාරයට කැඳවිය යුතු අතර එම කාර්ය පටිපාටි, නාමයෝජනා කමිටුවේ පළමු රැස්වීමේ දින සිට දින දහයක් ඇතුළත ශ්‍රී ලංකා ක්‍රිකට්හි වෙබ් අඩවියේ පළකරනු ලැබිය යුතු ය.

(5) නාමයෝජනා කමිටුවට, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ සහ 7 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම සඳහා නාමයෝජනා කමිටුව විසින් සුදුසු සහ යෝග්‍යය බවට සලකනු ලබන යම් තැනැත්තකු තෝරා ගැනීමේ සහ නම් කිරීමේ බලතල තිබිය යුතු ය.

(6) (i) (මෙහි මින් මතු "පූර්වගාමී මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ ජාතික ක්‍රීඩා සංගමයක විධායක කමිටුවක සාමාජිකයකු ලෙස, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, තෝරා පත් කර ගන්නා ලද හෝ තෝරා පත් කර ගනු ලැබ ඇති;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට්හි තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලද හෝ තෝරා පත් කර ගනු ලැබ ඇති; හෝ

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකුගේ ධුරය දරන්නකු වන හෝ වී ඇති,

තැනැත්තකු, මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(7) ස්වාධීන අධ්‍යක්ෂවරයකු තෝරා ගැනීම හා නම් කිරීම, නාමයෝජනා කමිටුවේ ගණපූරණය නොමැති යම් රැස්වීමක දී සිදු කරනු නොලැබිය යුතු ය.

(8) නාමයෝජනා කමිටුව විසින් තෝරා ගන්නා ලද සහ නම් කරන ලද තැනැත්තන්, මණ්ඩලය වෙත නාමයෝජනා භාරදීමෙන් පසු, මණ්ඩලය විසින් මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(9) තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්ගෙන් නාමයෝජනා කැඳවීම මඟින් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එම තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් ශ්‍රී ලංකා ක්‍රිකට්හි වාර්ෂික මහා සභා රැස්වීමක දී ඡන්දය ලබා දීමට හිමිකමක් ඇති සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එම නාමයෝජනා කැඳවීම සහ තෝරා පත් කර ගැනීම මේ පනත යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව විය යුතු ය.

පළමු මණ්ඩලය පත් කිරීම

**9.** (1) නාමයෝජනා කමිටුව විසින්, පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයන් ලෙස පත් කිරීම සඳහා නම් කළ යුතු තැනැත්තන් සලකා බැලීම සඳහා, මේ පනත ක්‍රියාත්මක වන දින සිට ගණන් බලනු ලබන දින හතළිස්පහක කාලයක් ඇතුළත දී ඉල්ලුම්පත් කැඳවනු ලැබිය යුතු ය.

(2) නාමයෝජනා කමිටුව විසින්, පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයන් වශයෙන් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වන දින සිට ගණන් බලනු ලබන දින එකසිය අසූවක් ඇතුළත තෝරා නම් කරනු ලැබිය යුතු ය.

(3) (මෙහි මින් මතු "වත්මන් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව විසින්, නාමයෝජනා කමිටුව විසින් නම් කරනු ලබන තැනැත්තන් පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයන් ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(4) වත්මන් මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මක වන දින සිට ගණන් බලනු ලබන දින එකසිය අසූවක කාලසීමාවක් තුළ,

ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් අතරින් පළමු මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් තෝරා පත් කර ගැනීම සඳහා පහසුකම් සලස්වනු ලැබිය යුතු ය. එම තෝරා පත් කර ගැනීම, ඉහත නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ පවත්වනු ලැබිය යුතු ශ්‍රී ලංකා ක්‍රිකට්හි පළමු මහා සභා රැස්වීමට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සිදු කරනු ලැබිය යුතු ය.

(5) පළමු මණ්ඩලයේ ධුර කාලය, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර ස්වාධීන අධ්‍යක්ෂවරයන්ගේ පත් කිරීම සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන්ගේ තෝරා පත් කර ගැනීම සම්පූර්ණ කරනු ලැබූ විට ආරම්භ කරනු ලැබිය යුතු ය.

ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ ධුර කාලය

**10.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයකු ම මිය යාමෙන්, නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහුගේ පත්වීමේ දින සිට වසර හතරක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, ධුරයෙන් ඉවත් කළහොත් මිස, අනුගාමී හෝ අනන්‍යාකාරයකින්, නාමයෝජනා කමිටුවේ අභිමතය පරිදි එක් වැඩිදුර කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකා ක්‍රිකට් පාලනයේ සහ පරිපාලනයේ අඛණ්ඩතාව සහතික කිරීමේ දැක්මෙන් යුතුව, 9 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් විසින් පහත දැක්වෙන පරිදි විවිධ කාලසීමාවන් සඳහා ධුරය දරනු ලැබිය යුතු ය:-

(අ) පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනකු විසින්, ඔවුන්ගේ පත්වීමේ දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට්හි පළමු වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන දිනය තෙක් ධුරය දැරිය යුතු ය;

(ආ) පළමු මණ්ඩලයේ ඉතිරි ස්වාධීන අධ්‍යක්ෂවරයන්ගෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින්, ඔවුන්ගේ පත්වීමේ දින සිට

ශ්‍රී ලංකා ක්‍රිකට්හි දෙවන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන දිනය තෙක් ධුරය දැරිය යුතු ය;

(ඇ) පළමු මණ්ඩලයේ ඉතිරි ස්වාධීන අධ්‍යක්ෂවරයන්ගෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින්, ඔවුන්ගේ පත්වීමේ දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට්හි තුන්වන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන දිනය තෙක් ධුරය දැරිය යුතු ය; සහ

(ඈ) පළමු මණ්ඩලයේ ඉතිරි ස්වාධීන අධ්‍යක්ෂවරයා විසින්, ඔහුගේ පත්වීමේ දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට්හි හතරවන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන දිනය තෙක් ධුරය දැරිය යුතු ය.

එකී ස්වාධීන අධ්‍යක්ෂවරයන්, ඔවුනොවුන් අතර අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස, කුසපත් ඇදීම මඟින් තෝරා ගනු ලැබිය යුතු ය.

(3) පළමු මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය සහ 8 වන වගන්තිය ප්‍රකාර පසුව පත් කරනු ලබන මණ්ඩලයක ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කරනු ලබන අවස්ථාවක, එකී ස්වාධීන අධ්‍යක්ෂවරයා වසර හතරක වෙනත් එක් ධුර කාලයක් සඳහා පමණක් පත් කරනු ලැබිය යුතු අතර, වැඩිදුර ධුර කාලයක් සඳහා පත් කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

**11.** (1) මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලබන සෑම අධ්‍යක්ෂවරයකු විසින් ම, මිය යාම, නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරනු ලැබුහොත් මිස, එකී තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයා විසින් වසර හතරක ධුර කාලයක් සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාලය

(2) තැනැත්තකු, තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂකවරයකු ලෙස එම තැනැත්තාගේ ජීවිත කාලය අතරතුර වසර අටක්

ඉක්මවන සමස්ත කාලසීමාවක් සඳහා, අඛණ්ඩව හෝ වරින් වර සේවය නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස, පූර්වගාමී මණ්ඩලයේ විධායක කමිටුවේ ධුර දරන්නකු හෝ සාමාජිකයකු ලෙස ධුරයක සේවය කරන ලද සමස්ත කාලසීමා, එකී කාලසීමාව මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව එළඹුණා වුව ද, පසුව එළඹුණා වුව ද, (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන කාලසීමාව ගණනය කිරීමේ දී, එකතු කර ගණන් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ධුරයේ වසර අටක එකී සමස්ත සේවා කාලසීමාව සම්පූර්ණ කර ඇති තැනැත්තකු, තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත් කර ගැනීමට ස්ථිර වශයෙන් ම නුසුදුස්සකු විය යුතු ය. තැනැත්තකු තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත තෝරා පත් කර ගනු ලබන විට, එකී තැනැත්තාට, ඉහත කී වසර අටක උපරිම සමස්ත කාලසීමාව ඉක්මවීමෙන් තොරව වසර හතරක පූර්ණ ධුර කාලය සම්පූර්ණ කිරීමේ හැකියාව ඇත්නම් පමණක්, එම තැනැත්තා තෝරා පත් කරගනු ලබන අධ්‍යක්ෂවරයකු ලෙස නැවත තෝරා පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

(5) යම් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු මිය යාමෙන්, නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ 12 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර ඉවත් කිරීමෙන් ධුරය හිස් කරනු ලබන විට, එම පුරප්පාඩුව ඇති වූ දින සිට දින අනූවක් තුළ තත්කාර්ය සඳහා කැඳවනු ලබන ශ්‍රී ලංකා ක්‍රිකට්හි විශේෂ මහා සභා රැස්වීමක දී වෙනත් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු තෝරා පත් කිරීමෙන් එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු අතර, එම තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයා විසින්, ඔහු අනුප්‍රාප්ත වන තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලසීමාව සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

ස්වාධීන අධ්‍යක්ෂවරු සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරු ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**12.** (1) මණ්ඩලයේ යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු විසින්, ඕනෑම අවස්ථාවක, මණ්ඩලයේ සභාපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) මණ්ඩලය විසින්, මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක ආකාරයෙන් 21 වන වගන්තිය යටතේ පත් කරනු ලබන විනය සහ ආරවුල් කමිටුව විසින් විෂමාචාරයකට වරදකරු කරනු ලැබූ මණ්ඩලයේ යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු, ඊට හේතු දක්වා, ඉවත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ තුනෙන් දෙකක ඡන්දය, යෝජනා සම්මතය සලකා බලනු ලබන්නේ යම් අධ්‍යක්ෂවරයකුට එරෙහිව ද එම අධ්‍යක්ෂවරයා බැහැර කොට, ගණනය කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකුට රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය කිරීමට නොහැකි වන අවස්ථාවක, නාමයෝජනා කමිටුව විසින්, එම ස්වාධීන අධ්‍යක්ෂවරයා වෙනුවට කටයුතු කිරීමට, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය ප්‍රකාර යම් සුදුසු තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින්, නාමයෝජනා කමිටුව විසින් නම් කරන ලද එම තැනැත්තා එම ස්වාධීන අධ්‍යක්ෂවරයා නොමැති කාලය තුළ ඔහුගේ ධුරයේ කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, -

(අ) ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු විසින් රැස්වීමට නොපැමිණෙන බව සභාපතිවරයාට පූර්වයෙන් දැනුම් දීමෙන් තොරව, මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින්, යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර

ගනු ලබන අධ්‍යක්ෂවරයකු ඉවත් කරනු ලබන අවස්ථාවක,

මණ්ඩලය විසින්, යෝජනා සම්මතයක් මඟින්, ස්වාධීන අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් වන විට, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය ප්‍රකාර පුරප්පාඩුව පිරවීම සඳහා අලුත් ස්වාධීන අධ්‍යක්ෂවරයකු තෝරා නම් කරන ලෙසට නාමයෝජනා කමිටුවෙන් ද, තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් වන විට, පුරප්පාඩුව පිරවීමට අලුත් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු 11 වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාර තෝරා පත් කර ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට පියවර ගන්නා ලෙසට ද ඉල්ලීම් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් සහ රැස්වීමක් සඳහා ගණපූරණය

**13.** (1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය, මණ්ඩලයේ අධ්‍යක්ෂවරු හත්දෙනකු විය යුතු අතර ඔවුන්ගෙන් අවම වශයෙන් හතරදෙනකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීම ආරම්භ කිරීම සඳහා නියමිත වේලාවේ සිට මිනිත්තු තිහක් ඇතුළත ගණපූරණය පැමිණ නොමැති අවස්ථාවක, ඊළඟ සතියේ එම දිනයට ම, එම වේලාවට ම, සහ එම ස්ථානයේ දී ම රැස්වීම පැවැත්වීමට හෝ සභාපතිවරයා විසින් හෝ ඔහු නොපැමිණි අවස්ථාවක, නියෝජ්‍ය සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් දිනයක, වේලාවක සහ ස්ථානයක දී රැස්වීම පැවැත්වීමට රැස්වීම කල් තැබිය යුතු ය. එම කල් තබන ලද රැස්වීමේ දී ගණපූරණය පැමිණ නොමැති අවස්ථාවක, එම ගණපූරණය සපුරාලන තෙක් රැස්වීම එම ආකාරයෙන් ම නැවත කල් තැබිය යුතු ය.

(3) සභාපතිවරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක ලිඛිත දැන්වීම, අවම වශයෙන් දින තුනකට පෙරාතුව, මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයන් සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් වෙත ලබා දිය යුතු ය:

එසේ වුව ද, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් සැලකිය යුතු හානියක්, අලාභයක්, බාධාවක් හෝ අවධානමක් වැළැක්වීමට

මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු යම් කාරණාවක් සඳහා කඩිනම් සහ ක්ෂණික ක්‍රියාමාර්ග අවශ්‍ය වන විට, මණ්ඩලයේ සභාපතිවරයාට, එම දැන්වීම් අවශ්‍යතාව අත්හැර දැමීමට හෝ කෙටි කිරීමට බලතල තිබිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් -

(අ) රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින සාමාජික සංඛ්‍යාව මඟින්; හෝ

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය මාර්ගයෙන්; හෝ

(ඇ) (අ) වන සහ (ආ) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති ක්‍රම මඟින්,

ගණපූරණය සංස්ථාපනය කරමින් පවත්වනු ලැබිය හැකි ය.

(5) සභාපතිවරයා විසින්, මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට, නියෝජ්‍ය සභාපතිවරයා විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා යන දෙදෙනාම නොපැමිණි අවස්ථාවක පැමිණ සිටින ස්වාධීන අධ්‍යක්ෂවරයන් සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් විසින් එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින ස්වාධීන අධ්‍යක්ෂවරයන් අතරින් ස්වාධීන අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ යම් රැස්වීමක සියලු තීරණ, එම රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය භාවිත කරන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු අතර, 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට මණ්ඩලයේ යෝජනා සම්මතයක් ආකාරයෙන් සම්මත කළ යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට, ස්වකීය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය. සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක නියෝජ්‍ය

සභාපතිවරයාට, ස්වකීය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය. සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති නම්, පැමිණ සිටින ස්වාධීන අධ්‍යක්ෂවරයන් සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් විසින් එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලබන ස්වාධීන අධ්‍යක්ෂවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(7) මණ්ඩලයේ රැස්වීම්, කලින් කල, මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලට සහ පිහිටවනු ලබන කාර්යපටිපාටිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීම හේතුව මත මණ්ඩලයේ ක්‍රියා සහ කටයුතු අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**14.** මණ්ඩලය විසින්, මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සංස්ථාපනය කිරීමට ප්‍රමාණවත් වන තාක්, මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, එය නොතකා, ක්‍රියා කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම සඳහා වන පාරිශ්‍රමික

**15.** සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයකුට ම සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකුට ම 21 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පාලන සහ සුපිළිපන්න කමිටුව විසින් නිර්දේශිත පරිදි සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

මූල්‍ය හෝ වෙනත් බැඳියාවන් පිළිබඳ සටහන

**16.** (1) මණ්ඩලය විසින් සලකා බලනු ලැබිය යුතු යම් ප්‍රසම්පාදනයක්, කාරණයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රාකාරව යම් බැඳියාවක් ඇති යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු විසින්, එම කාරණය සලකා බලනු ලබන රැස්වීමේ දී, එම බැඳියාවේ ස්වභාවය සහ ප්‍රමාණය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, එම හෙළිදරව් කිරීම රැස්වීමේ සටහන්වල නිසි පරිදි වාර්තා කරනු ලැබිය යුතු ය. එම ස්වාධීන අධ්‍යක්ෂවරයා හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයා විසින්, ඒ කාරණයට අදාළ යම් සාකච්ඡාවකට,

විචාරයකට හෝ තීරණ ගැනීමේ ක්‍රියාවලියකට සහභාගී නොවිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතු ය.

(2) චරිත දූෂණයකට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් යම් විමර්ශනයකට යටත්ව සිටින යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු හෝ මණ්ඩලයේ කර්තව්‍යවල තම ක්‍රියාකාරී සහභාගිත්වය වළක්වන, විශේෂිතව විධිවිධාන සලස්වා නොමැති වෙනත් බැඳියාවන් පිළිබඳ ඝට්ටනයක් ඇති යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු, මණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මඟින් සේවය අත්හිටවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ යෝජනා සම්මතය සම්මත කිරීම

**17.** මණ්ඩලයේ සෑම යෝජනා සම්මතයක් ම, එම යෝජනා සම්මතය සාමාජිකයන් අතර පූර්වයෙන් සංසරණය කිරීමෙන් සම්මත කර ගත යුතු ය. සම්මත කරගත යුතු යෝජනා සම්මතය පෙරාතුව සෑම සාමාජිකයකු වෙත ලැබී ඇත්නම් මිස, එම යෝජනා සම්මතය මණ්ඩලයේ රැස්වීමක දී සම්මත නොකළ යුතු ය.

පෙරාතුව ම වූ සභාපති, නියෝජ්‍ය සභාපති, ස්වාධීන අධ්‍යක්ෂවරයන් හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් විසින් ලේඛන භාර දීම

**18.** ධුර කාලය ඉකුත් වන මණ්ඩලයේ සෑම සභාපතිවරයකු ම, නියෝජ්‍ය සභාපතිවරයකු ම, ස්වාධීන අධ්‍යක්ෂවරයකු ම හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු ම විසින් ම, ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාරණාවලට අදාළ සියලු ලේඛන, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයාට හෝ උපසභාපතිවරයාට භාර දිය යුතු ය.

ඔප්පු, විකුණුම්කර, පැවරුම්කර, එකඟතා ආදිය අත්සන් කිරීමේ, ලියා අත්සන් කිරීමේ, සහතික කිරීමේ ආදියෙහි අධිකාරී බලය

**19.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි මණ්ඩලයේ සභාපතිවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට සහ එම කාර්යය සඳහා මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මඟින් බලය ලබා දී ඇති යම් ස්වාධීන අධ්‍යක්ෂකවරයකුට හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකුට සියලු ඔප්පු, විකුණුම්කර, පැවරුම්කර, එකඟතා, ගිවිසුම්, සාධන පත්‍ර, උත්තරවාද, ඉල්ලීම්, දිවුරුම් ප්‍රකාශ, බැංකු ලේඛන, ඇපකර, ඇප, භාරගැනීම්, ආයතනික වාර්තා, ලිපි ගනුදෙනු සහ ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු, පරිපාලනය, ව්‍යාපාර කටයුතු, මෙහෙයුම්, අයිතිවාසිකම්, වගකීම් සහ ක්‍රියාකාරකම්

සම්බන්ධයෙන් අවශ්‍ය නියමිත කවර හෝ ආකාරයෙන් වන වෙනත් සියලු ලේඛන, ලියවිලි සහ සාධන පත්‍ර සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙනුවට අත්සන් කිරීම, ලියා අත්සන් කිරීම, සාක්ෂි දැරීම, සහතික කිරීම සහ භාරදීම සඳහා බලය ලබාදිය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි මුද්‍රාව

**20.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල මුද්‍රාව යම් ලේඛනයක තබන විට, මණ්ඩලයේ යෝජනා සම්මතයක් මඟින් බලය ලබා දිය හැකි යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකුගේ හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකුගේ හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් නිලධරයකුගේ අත්සන සමඟ සභාපතිවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධරයාගේ අත්සන මඟින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛනවල ලේඛනයක් පවත්වාගත යුතු ය.

කමිටු පත් කිරීම

**21.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතුවල එක් එක් අංශය පරිපාලනය සහ පාලනය කිරීම සඳහා, මණ්ඩලය විසින් පහත දැක්වෙන කමිටු පිහිටවනු ලැබිය යුතු ය:-

(අ) ක්‍රිකට් කමිටුව;

(ආ) මූල්‍ය, විගණන සහ ආයෝජන කමිටුව;

(ඇ) සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටුව;

(ඈ) ජාතික පිරිමි තේරීම් කමිටුව;

(ඉ) ජාතික කාන්තා තේරීම් කමිටුව;

(ඊ) (ශ්‍රී ලංකා ක්‍රිකට්වලින් ස්වාධීන වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු) විනය සහ ආරවුල් කමිටුව;

(උ) මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව;

(ඌ) දේශීය ක්‍රිකට් කටයුතු පිළිබඳ කමිටුව;

(එ) ජාත්‍යන්තර ක්‍රිකට් කටයුතු පිළිබඳ කමිටුව;

(ඒ) පාලන සහ සුපිළිපන්න කමිටුව;

(ඔ) කාන්තා ක්‍රිකට් කමිටුව;

(ඕ) පාසල් ක්‍රිකට් කමිටුව; සහ

(ක) (ක්‍රීඩක සංගමයේ නියෝජිතයකු ද ඇතුළු) ක්‍රීඩක කමිටුව.

(2) මණ්ඩලයට, කලින් කල, මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් අනුකමිටු පත් කිරීමේ බලතල තිබිය යුතු ය.

(3) යම් තැනැත්තෙකු විසින් ඔහුගේ ජීවිත කාලය තුළ සමුච්චිත එකතුව වසර අටක් වන කාලසීමාවක් සඳහා පූර්වගාමී මණ්ඩලයේ විධායක කමිටුවේ සාමාජිකයකු ලෙස, ශ්‍රී ලංකා ක්‍රිකට්හි මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි ධුර දරන්නකු ලෙස, ශ්‍රී ලංකා ක්‍රිකට් ඇතුළත යම් කමිටුවක හෝ අනුකමිටුවක අධ්‍යක්ෂවරයකු හෝ සාමාජිකයකු ලෙස සේවය කර ඇත්නම්, ඒ තැනැත්තා ශ්‍රී ලංකා ක්‍රිකට්හි කමිටුවකට හෝ අනුකමිටුවකට පත් කිරීමට හෝ නැවත පත් කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

(4) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, යම් කමිටුවකට හෝ අනුකමිටුවකට තැනැත්තන් පත් කිරීමට බලතල තිබිය යුතු ය.

(5) එම පත්කිරීම් සිදුකිරීමේ දී, එලෙස පත් කරනු ලබන සාමාජිකයන් සතුව හොඳ සදාචාරාත්මක සහ ආචාරධර්ම ස්ථාවරත්වයක් ඇති බවටත් අදාළ කමිටුවේ හෝ අනුකමිටුවේ වගකීම් ඵලදායි ලෙස ඉටු කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව, පළපුරුද්ද සහ කුසලතා සතුව ඇති බවටත් මණ්ඩලය විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(6) එම කමිටුවල හෝ අනුකමිටුවල සංයුතියට, මණ්ඩලය විසින් එම කමිටුවල හෝ අනුකමිටුවල සාකච්ඡා සහ කර්තව්‍යවලට අර්ථාන්විත ලෙස දායක විය හැකි බවට සලකනු ලබන තැනැත්තන් ඇතුළුව ශ්‍රී ලංකා ක්‍රිකට්හි අධ්‍යක්ෂවරයන් හෝ සේවානියුක්තයන් නොවන තැනැත්තන් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(7) එම එක් එක් කමිටුවක හෝ අනුකමිටුවක, කාර්යභාරය, බලතල, සංයුතිය, වගකීම් වාර්තා කිරීම සහ මණ්ඩලය විසින් රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් එවැනි කාරණා නිශ්චිතව දක්වමින් එම කමිටුව හෝ අනුකමිටුව සඳහා ලිඛිත යොමු කිරීමේ නිර්ණායක අනුමත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට නියම කරනු ලැබිය යුතු ය.

(8) මේ පනතේ විධිවිධානවලට යටත්ව, එක් එක් කමිටුවට, අනුකමිටුවක් පත් කිරීම ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි බලතල සහ අධිකාරයන් අදාළ කමිටුවේ යොමු කිරීමේ නිර්ණායකවල තිබිය යුතු ය.

(9) එක් එක් කමිටුවේ සහ අනුකමිටුවේ රැස්වීම් සහ කටයුතු, එක් එක් කමිටුවේ සහ අනුකමිටුවේ යොමු කිරීමේ නිර්ණායක මඟින් පාලනය කරනු ලැබිය යුතු ය.

(10) මණ්ඩලයේ සභාපතිවරයාට සහ ප්‍රධාන විධායක නිලධරයාට විනය සහ ආරවුල් කමිටුව හැර, යම් කමිටුවක හෝ අනුකමිටුවක යම් රැස්වීමකට එහි නිලබලයෙන් පත් වූ සාමාජිකයකු ලෙස පැමිණීමට අයිතියක් තිබිය යුතු නමුත් යම් කමිටුවක හෝ අනුකමිටුවක යම් රැස්වීමක දී ඡන්දය ලබා දීමට අයිතියක් නොතිබිය යුතු ය.

(11) කමිටුවල සහ අනුකමිටුවල රැස්වීම්වල සියලු කටයුතුවල වාර්තා තබා ගනු ලැබිය යුතු අතර ඒ රැස්වීම්වලින් මතුවන යම් නිර්දේශවල සංක්ෂිප්ත සටහන් මණ්ඩලයේ ඊළඟ රැස්වීමේ දී මණ්ඩලය වෙත ලබා දිය යුතු ය.

## III වන කොටස

### නාමයෝජනා කමිටුව

නාමයෝජනා කමිටුව

**22.** (1) නාමයෝජනා කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සභාවේ සභාපතිවරයා හෝ එම සභාවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම ආයතනයේ යම් සාමාජිකයකු;

(ආ) ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා හෝ එම සංගමයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම සංගමයේ යම් සාමාජිකයකු;

(ඇ) (289 වන අධිකාරය වූ) වාණිජ මණ්ඩල ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද වාණිජ මණ්ඩලයේ කමිටුවේ සභාපතිවරයා හෝ එම කමිටුවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම කමිටුවේ යම් සාමාජිකයකු;

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ක්‍රීඩා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිලයට පහළ නිලයක නොවන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(ඉ) ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සභාපතිවරයා හෝ එහි සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම ආයතනයේ යම් සාමාජිකයකු; සහ

(ඊ) 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ කමිටුවේ සභාපතිවරයා හෝ එම කමිටුවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම ආයතනයේ යම් සාමාජිකයකු; සහ

(උ) ක්‍රීඩා පනතේ 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික ක්‍රීඩා සභාවේ සභාපතිවරයා හෝ එහි සභාපතිවරයා විසින් නම් කරනු ලබන ජාතික ක්‍රීඩා සභාවේ යම් සාමාජිකයකු.

(2) තැනැත්තකු, (1) වන උපවගන්තිය යටතේ නාමයෝජනා කමිටුවේ සාමාජිකයකු ලෙස නම් කරනු ලැබ ඇති අවස්ථාවක, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන තැනැත්තා විසින්, නාමිකයා -

(අ) යහපත් සදාචාරාත්මක ස්ථාවරත්වයකින් සහ චරිතයකින් යුතු තැනැත්තකු බවට;

(ආ) අදාළ ක්ෂේත්‍රය තුළ පිළිගත් සුදුසුකම් සහ සැලකිය යුතු පළපුරුද්දක් සතු විශිෂ්ටත්වයෙන් යුතු තැනැත්තකු බවට; සහ

(ඇ) 7 වන වගන්තිය ප්‍රකාර නුසුදුසුකම්වලට යටත් නොවූ බවට,

සහතික කරනු ලැබිය යුතු ය.

නාමයෝජනා කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට හෝ නම් කිරීමට නුසුදුසුකම්

**23.** තැනැත්තකු, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජික වර්ගයක ධුර දරන්නකු හෝ යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් හෝ බවට පත්වන්නේ නම් හෝ 7 වන වගන්තිය ප්‍රකාර යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, එම තැනැත්තා නාමයෝජනා කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

නාමයෝජනා කමිටුවේ සභාපතිවරයා

**24.** (1) නාමයෝජනා කමිටුවේ සාමාජිකයන් විසින්, ඔවුන් අතරින්, නාමයෝජනා කමිටුවේ සභාපතිවරයාව පත් කර ගනු ලැබිය යුතු ය.

(2) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවකට පත්වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට, සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, නාමයෝජනා කමිටුවේ සාමාජිකයන් විසින්, සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් සාමාජිකයකු පත් කර ගනු ලැබිය හැකි ය.

නාමයෝජනා කමිටුවේ ධුරය හිස් කිරීම

**25.** නාමයෝජනා කමිටුවේ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම මත හෝ 23 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නුසුදුස්සකු වන අවස්ථාවක 22 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

නාමයෝජනා කමිටුවේ ගණපූරණය සහ රැස්වීම්

**26.** (1) නාමයෝජනා කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය, සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

(2) නාමයෝජනා කමිටුවේ රැස්වීමක් -

(අ) රැස්වීම සඳහා වෙන් කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින සාමාජික සංඛ්‍යාව මඟින්; හෝ

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය මාර්ගයෙන්; හෝ

(ඇ) (අ) වන සහ (ආ) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති ක්‍රමවල සම්මිශ්‍රණය මඟින්,

ගණපූරණය සංස්ථාපනය කරමින් පවත්වනු ලැබිය හැකි ය.

(3) නාමයෝජනා කමිටුවේ යම් රැස්වීමක දී ගනු ලැබිය යුතු සියලු තීරණ, එම රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ

බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, ඒ රැස්වීමේ සභාපතිවරයාට, ඔහුගේ ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) සභාපතිවරයා විසින්, පැමිණ සිටින්නේ නම්, නාමයෝජනා කමිටුවේ සියලු ම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(5) රීති මඟින්, කලින් කල, නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාර්යපටිපාටියට අනුකූලව නාමයෝජනා කමිටුවේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල වර්ණ, සහ නිල ලාංඡනය, අනුශාසකවරයා සහ සාමාජිකයන්

ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල වර්ණ හා නිල ලාංඡනය

**27.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල වර්ණ සහ නිල ලාංඡනය, රීති මාර්ගයෙන් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි අනුශාසකවරයා

**28.** ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ශ්‍රී ලංකා ක්‍රිකට්හි අනුශාසකවරයා විය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා ක්‍රිකට්හි අනුශාසකවරයා ලෙස කටයුතු කිරීම ජනාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, මණ්ඩලයේ ඉල්ලීම පරිදි අනුශාසකවරයාගේ ධුරය පිළිගැනීමට එකඟ විය හැකි වෙනත් යම් තැනැත්තකු අනුශාසකවරයා විය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් ලියාපදිංචි කිරීම

**29.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වර්ගවලින් සමන්විත විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව පූර්වගාමී මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව

දක්වා ඇති යෝග්‍යතා නිර්ණායකවලට අනුකූල වන සෑම සංගමයක් ම, ඒකාබද්ධ සංගමයක් ම හෝ මණ්ඩලයක් ම විසින්, රීති මගින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට්හි ලියාපදිංචි වීම සඳහා මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට දින තිහක කාලසීමාවක් ඇතුළත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක සම්පූර්ණ කරන, ශ්‍රී ලංකා ක්‍රිකට්හි සියලු වර්ගවල සාමාජිකයන් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු අතර රීති මගින් නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය. එකී ලියාපදිංචි කිරීම මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එකී නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි එක් එක් සාමාජිකත්ව වර්ගයට අදාළ වන පාලන, ගිණුම්කරණ, පරිපාලන සහ ක්‍රිකට් කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රමිතීන් සහ වෙනත් අදාළ යම් කොන්දේසි, රීති මාර්ගයෙන් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි, ඒවා, කලින් කල, සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

සාමාජික ගාස්තු

**30.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි එක් එක් සාමාජික වර්ගයක් සඳහා සාමාජිකත්වය සඳහා වන ගාස්තුව හා වාර්ෂික දායක මුදල රීති මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) සියලු සාමාජික ගාස්තු සහ වාර්ෂික දායක මුදල්, කලින් කල, බලපැවැත්වෙන අදාළ රජයේ සියලු බදුවලට යටත් විය යුතු ය.

(3) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වන වාර්ෂික දායකත්ව මුදල, අදාළ වර්ෂයට පෙරාතුව ම වන වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින හෝ ඊට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(4) වාර්ෂික දායකත්ව මුදල (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින හෝ ඊට පෙර ගෙවනු නොලබන අවස්ථාවක,

පැහැර හැරීම සිදු කරන ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයා, ඊළඟ වර්ෂයේ අප්‍රේල් මස තිස් වන දින හෝ ඊට පෙර, ගෙවීමට ඇති වාර්ෂික දායකත්ව මුදලෙන් දෙගුණයකට සමාන වූ, ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින හෝ ඊට පෙර (මෙම වගන්තියේ “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන), අදාළ ප්‍රමාද ගෙවීම සමඟ වාර්ෂික දායකත්ව මුදල ගෙවීමට ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකු අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයාගේ ඡන්දය ලබා දීමේ අයිතිවාසිකම්, ඒ සාමාජිකයාට ස්වයංක්‍රීයව අහිමි විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් කරන ලද සාමාජිකයකු නියමිත දිනයෙන් ඉක්බිතිව ම එළඹෙන දිනයේ දී ආරම්භ වන මාස හයක කාලසීමාව තුළ ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාණය සහ ප්‍රමාද ගෙවීම් ගාස්තුව ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක දී ඒ සාමාජිකයා සාමාජිකයන්ගේ නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකත්වය අත්හිටුවීම, අහෝසි කිරීම හෝ වෙනත් ආකාරයකින් අවසන් කිරීම

**31.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකු මේ පනතේ යම් විධිවිධාන, ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකත්වය ලියාපදිංචි කිරීමට සම්බන්ධිත යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති අවස්ථාවක 21 වන වගන්තියේ සඳහන් කරන ලද විනය සහ ආරවුල් කමිටුව විසින් සිදු කරනු ලබන නිර්දේශ මත, එම සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවීමේ, ඉවත් කිරීමේ හෝ වෙනත් ආකාරයකින් අවසන් කිරීමේ බලතල ශ්‍රී ලංකා ක්‍රිකට් සතු විය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි වාර්ෂික මහා සභා රැස්වීම සහ විශේෂ මහා සභා රැස්වීම සහ ඡන්දය දීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම

**32.** (1) මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි ස්වකීය වාර්ෂික මහා සභා රැස්වීම, එක් එක් මුදල් වර්ෂයේ පළමු මාස හය ඇතුළත පවත්වනු ලබන බවට සහතික කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් අතරින් (මෙහි මින් මතු “ඡන්දය දෙන සාමාජිකයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) “ඒ” කාණ්ඩයේ සාමාජිකයන්, “බී” කාණ්ඩයේ සාමාජිකයන් සහ පළාත් ක්‍රිකට් සංගමය, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) ඡන්දය දෙන සාමාජිකයන්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි මහා සභා රැස්වීම්වලට පැමිණීමට සහ නියෝජනය කිරීමට සහ මේ පනත යටතේ ඒ සාමාජිකයන්ට වෙන් කර ඇති ඡන්ද සංඛ්‍යාවට අනුව ඡන්දය දීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(4) එක් එක් ඡන්දය දෙන සාමාජිකයා විසින්, එම සාමාජිකයා විසින් නිකුත් කරන ලද නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලිඛිත නාමයෝජනාවක් මඟින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමකට පැමිණීමට, සහභාගි වීමට සහ ඒ සාමාජිකයාගේ ඡන්දය දීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට නියෝජිතයකුට බලය ලබා දෙනු ලැබිය යුතු ය.

(5) ඡන්දය දෙන සාමාජිකයකුගේ එක් එක් නිසි පරිදි බලයලත් නියෝජිතයකු, මේ පනත යටතේ ඔහු නියෝජනය කරන එම සාමාජිකයාට වෙන් කර ඇති ඡන්ද සංඛ්‍යාව ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලැබිය යුතු අතර, එකම මහා සභා රැස්වීමක දී ශ්‍රී ලංකා ක්‍රිකට්හි එක් ඡන්දය දෙන සාමාජිකයකුට වඩා නියෝජනය කරනු නොලැබිය යුතු ය.

(6) "සී" කාණ්ඩයේ සාමාජිකයන්, නිසි පරිදි බලයලත් එක් නියෝජිතයකු මඟින්, නිරීක්ෂකයකු ලෙස පමණක් මහා සභා රැස්වීම්වලට පැමිණීමට හිමිකම් ලැබිය යුතු අතර, එම මහා සභා රැස්වීමේ සංවිචාරණවලට සහභාගී වීමට හෝ එහි යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(7) "සී" කාණ්ඩයේ සාමාජිකයන් හැර ඡන්දය නොදෙන සාමාජිකයන්, නිසි පරිදි බලයලත් එක් නියෝජිතයකු මඟින්, නිරීක්ෂකයකු ලෙස පමණක් මහා සභා රැස්වීම්වලට පැමිණීමට හිමිකම් ලැබිය යුතු අතර, එම මහා සභා රැස්වීමක සංවිචාරවලට සහභාගී වීමට හෝ එහි යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(8) අදාළ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයාගේ සභාපතිවරයා සහ ලේකම්වරයා විසින්, බලයලත් නියෝජිතයාගේ නම හෝ නියෝජිතයන්ගේ නම්, අදාළ මහා සභා රැස්වීමට දින හතකට

නොඅඩු කාලයකට පෙරාතුව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(9) ඡන්දය දෙන සාමාජිකයකු නියෝජනය කරන කිසිදු තැනැත්තකු විසින්, එකම මහා සභා රැස්වීමේ දී එකී සාමාජිකයාට හිමි ඡන්ද අයිතිවාසිකම්වලට වඩා වැඩි ඡන්ද අයිතිවාසිකම් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(10) මහා සභා රැස්වීමක දී ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකු නියෝජනය කිරීමට නම් කරනු ලබන තැනැත්තකු -

(අ) ඒ සාමාජික ක්‍රීඩා සාමාජයේ හෝ සංගමයේ විධායක කමිටුවේ හෝ ඊට සමාන තීරණ ගන්නා මණ්ඩලයෙහි සාමාජිකයකු වන; හෝ

(ආ) වසර පහකට අඩු නොවන අඛණ්ඩ කාලසීමාවක් සඳහා අදාළ ක්‍රීඩා සමාජයේ හෝ සංගමයේ සාමාජිකයකු වන,

තැනැත්තකු විය යුතු ය.

(11) මණ්ඩලය විසින්, මේ පනත යටතේ සාදන ලද රීති මඟින්, මහා සභා රැස්වීම්වල නියෝජිතයන්ගේ අතිරේක යෝග්‍යතා නිර්ණායක, නාමයෝජනා කිරීම, සත්‍යායනය කිරීම සහ සහභාගිත්වයට අදාළ කාර්යපටිපාටි සහ කොන්දේසි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(12) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක් සඳහා ගණපූරණය, ඡන්දය දෙන සමස්ත සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(13) රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි එකී කාලය තුළ යම් මහා සභා රැස්වීමක් සඳහා ගණපූරණය නොපවතින අවස්ථාවක, මහා සභා රැස්වීමේ සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති නම්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි ප්‍රධාන විධායක නිලධරයා හෝ

මණ්ඩලය විසින් බලය පවරන ලද යම් නිලධාරියකු හෝ යම් අධ්‍යක්ෂවරයකු විසින්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් දිනයකට ඒ මහා සභා රැස්වීම කල් තබනු ලැබිය යුතු ය. කල් තබන ලද මහා සභා රැස්වීම සඳහා, දින දාහතරකට අඩු නොවන කාලයකින් දැන්වීමක් එම න්‍යාය පත්‍රයෙන් ම ලබා දිය යුතු ය. එම කල් තබන ලද මහා සභා රැස්වීමේ දී, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් ගණපූරණය සමන්විත විය යුතු අතර, න්‍යාය පත්‍රයේ සඳහන් කටයුතු පූර්ණ වලංගුභාවයෙන් සහ අධිකාරී බලයෙන් යුතුව කරගෙන යනු ලැබිය හැකි ය.

(14) මහා සභා රැස්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය, මේ පනත යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්ගේ ව්‍යවස්ථාව

**33.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම සාමාජිකයකු සතුව ම, සාමාජිකත්වය පිළිබඳ, ධුර දරන්නන් පත් කිරීම සහ ඉවත් කිරීම පිළිබඳ කොන්දේසි, ධුර කාලයට කරනු ලබන සීමා, පාලක මණ්ඩලයේ සහ සාමාජිකයන්ගේ රැස්වීම්, විනයානුකූල කාර්යපටිපාටි, බැඳියාවන් පිළිබඳ සට්ටන, සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සහ යහපාලනය, විනිවිදභාවය, වගවීම සහ දූෂිත බැවින් තොර පරිපාලනය තහවුරු කිරීමට මේ පනත යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් කාරණාවලට අදාළ විධිවිධාන ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම සාමාජිකයකු ම විසින්, රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයෙන්, මේ පනත ක්‍රියාත්මක වන දින සිට වසර එකක් ඇතුළත, අනුමතය සඳහා ඒ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත ඒ අනුමතය ලබා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකු අපොහොසත් වන අවස්ථාවක, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින්, ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවනු හෝ අවසන් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්ගේ කාර්ය

**34.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම සාමාජිකයකු විසින් ම, සෑම වර්ෂයක ම අප්‍රේල් මස තිස් වන දින හෝ ඊට පෙර, ස්වකීය මහා සභා රැස්වීම පවත්වනු ලැබිය යුතු අතර, ඒ මහා සභා රැස්වීම පවත්වන ලද දින සිට මාසයක් ඇතුළත පහත දැක්වෙන ලේඛන, ශ්‍රී ලංකා ක්‍රිකට්හි ප්‍රධාන විධායක නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය:-

(අ) ඒ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වූ සාමාජිකයන්ගේ ලැයිස්තුව සහ ඒ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තේරී පත් වූ ධුර දරන්නන්ගේ ලැයිස්තුව, අදාළ වන්නේ නම්, සමඟ වාර්ෂික මහා සභා රැස්වීමේ සහතික කරන ලද වාර්තාව;

(ආ) සහතික කරන ලද සාමාජික ලැයිස්තුවක් ද සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට්හි එම සාමාජිකයාගේ සාමාජික නාමලේඛනයේ සාමාජික සංඛ්‍යාව දක්වමින් එම සාමාජිකයාගේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සහතික කරන ලද ප්‍රකාශයක්;

(ඇ) වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් විසින් නිසි පරිදි විගණනය කරන ලද සහ එකී වාර්ෂික මහා සභා රැස්වීමේ දී සම්මත කරන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ; සහ

(ඈ) අදාළ කාලසීමාව සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ගෙවන ලද අදාළ වන වාර්ෂික දායක මුදල් ගෙවූ බවට වන සාක්ෂි.

(2) නිශ්චිතව දක්වන ලද කාලය තුළ ස්වකීය වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට අපොහොසත් වන හෝ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන සැපයීමට අපොහොසත් වන ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකු, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සහභාගි වීමට හෝ එහි දී ඡන්දය ලබා දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(3) අදාළ වර්ෂයේ මැයි මස තිස් වන දින සිට මාස හයක් ඉක්ම වූ පසුවත් ඉහත සඳහන් කරන ලද යම් ලේඛනයක් ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයකු විසින් දිගින් දිගට ම භාර දීම පැහැර හරින සහ ඊට අසමත් වන අවස්ථාවක, ඒ මාස හයක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව මාසයක් ඇතුළත මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වලංගු හේතු මඟින් ඒ අපොහොසත් වීම සාධාරණීකරණය කරනු ලැබ ඒ හේතු ශ්‍රී ලංකා ක්‍රිකට්හි විශේෂ මහා සභා රැස්වීමක දී ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන්ගේ බහුතරයකින් අනුමත කරනු ලැබුවහොත් මිස, ඒ සාමාජිකයාගේ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකත්වය ස්වයංක්‍රීයව අවසන් වන්නේ ය.

**ශ්‍රී ලංකා ක්‍රිකට්හි තරහාවලි ව්‍යූහය**

**35.** (1) මණ්ඩලය විසින්, රීති මඟින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි තරහාවලි ව්‍යූහය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි පළමුවන තරහාවලි ව්‍යූහය 47 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වත්මන් මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට 5 වන වගන්තිය යටතේ හෝ 9 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මණ්ඩලයක් විසින් සිදු කළ හැකි යම් සංශෝධනයක්, වෙනස් කිරීමක් හෝ මද වශයෙන් වෙනස් කිරීමක් පහත නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් සිදු කරනු ලැබිය යුතු ය:-

(අ) මණ්ඩලයේ රැස්වීමක දී ස්වාධීන අධ්‍යක්ෂවරුන් සිව්දෙනකු සහ සභාපතිවරයා ඇතුළුව මණ්ඩලයේ මුළු අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දය පළමුව ලබා ගත යුතු ය; සහ

(ආ) ඉන්පසුව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය ලබාදෙන ශ්‍රී ලංකා ක්‍රිකට්හි ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දය ලබාගත යුතු ය.

## V වන කොටස

### ශ්‍රී ලංකා ක්‍රිකට්හි අරමුදල

ශ්‍රී ලංකා ක්‍රිකට්හි අරමුදල

**36.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අරමුදලට, -

(අ) මේ පනත යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබිය හැකි සියලු මුදල්; සහ

(ආ) මුදල් ලෙස හෝ වෙනත් යම් ආකාරයකින්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත පිරිනමන ලද, පවරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය විය හැකි සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අරමුදලට ලැබෙන සියලු මුදල්, මණ්ඩලය විසින්, කලින් කල, අනුමත කරනු ලැබිය හැකි එකී බැංකුවල සහ මූල්‍ය ආයතනවල තැන්පත් කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි ඒ සීමාව ඉක්මවන සියලු ගෙවීම්, හැකි සෑම අවස්ථාවක දී ම, චෙක්පත් මඟින්, ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු මඟින් හෝ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් බැංකුකරණ හෝ ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ මඟින් සිදු කරනු ලැබිය යුතු ය.

(6) සියලු චෙක්පත්, බැංකු අණකර, සහ වෙනත් බැංකු සාධන පත්‍ර, පහත දැක්වෙන ආකාරයෙන් අත්සන් කරනු ලැබ හෝ බලය පවරනු ලැබ තිබිය යුතු ය:-

(අ) එක් අත්සන්කරුවකු, මණ්ඩලයේ සභාපතිවරයා හෝ, සභාපතිවරයා නොමැති විට, ඒ කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලබන මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු විය යුතු ය; සහ

(ආ) දෙවන අත්සන්කරු, ප්‍රධාන විධායක නිලධරයා හෝ එම කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලබන වෙනත් යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයකු විය යුතු ය.

(7) මණ්ඩලය විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි බැංකු ගිණුම්වලට බැර කිරීම සඳහා වන චෙක්පත්, ඇණවුම් සහ ඊට සමාන ආකාරයේ වෙනත් සාධන පත්‍ර පිටසන් කිරීමට ප්‍රධාන විධායක නිලධාරියාට බලය පවරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි එකී මූල්‍ය පාලනයන්, කාර්යපටිපාටි සහ සීමාවලට යටත්ව ගෙවීම් අනුමත කිරීමට හෝ ගෙවීම්වලට බලය ලබා දීමට මණ්ඩලය විසින්, ලිඛිතව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයකුගේ හෝ ඊට ඉහළ ධුරයක් දරන ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් නිලධරයකුට හෝ සේවානියුක්තකුට, බලය පවරනු ලැබිය හැකි ය.

**37.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ශ්‍රී ලංකා ක්‍රිකට්හි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

### ප්‍රධාන විධායක නිලධරයා සහ කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම

**38.** (1) මණ්ඩලය විසින්, සුදුසුකම් සහ සේවානියුක්ති නියම සහ කොන්දේසි නිශ්චය කරනු ලැබිය යුතු ප්‍රධාන විධායක නිලධරයකු, මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. ප්‍රධාන විධායක නිලධරයාගේ පාරිශ්‍රමිකය, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් නිර්දේශ කරනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකුගේ නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ ධුර දරන්නකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි ධුර දරන්නකු හෝ නිලධාරියකු හෝ සේවානියුක්තයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඈ) සිහි විකල තැනැත්තකු හෝ ස්වකීය කාර්ය කරගෙන යාමට නොහැකි තැනැත්තකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඉ) නිදහස් කරනු නොලැබූ බංකොලොත් වූවකු වන්නේ නම් හෝ එසේ පත් වී ඇත්නම්;

(ඊ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු වන්නේ නම් හෝ එසේ පත් වී ඇත්නම්;

(උ) කලින් ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්;

(ඌ) ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ යම් ධුරයක් දැරීම සඳහා නුසුදුසුකම් සම්බන්ධයෙන් අයිසීසීහි රීති හෝ නියෝගවලට අනුකූලව මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් ප්‍රකාර ධුරයක් දැරීමට නුසුදුස්සකු වන්නේ නම්;

(එ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතළ විෂමාචාරයකට මින් පෙර වරදකරු කර ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්; හෝ

(ඒ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමට ක්‍රියාකර ඇත්නම්,

මණ්ඩලය විසින්, ඒ තැනැත්තා ප්‍රධාන විධායක නිලධරයා ලෙස පත් කරනු නොලැබිය යුතු අතර ප්‍රධාන විධායක නිලධරයා ලෙස පත් කරනු ලැබීම ඒ නයින් ම අවසන් කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා විසින්, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට හෝ පාලනයට යටත්ව, -

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්ය සහ කටයුතු පරිපාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් ඔහුට පවරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සිදු කරනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සියලු නියෝජිත කණ්ඩායම්, නියෝජිත පිරිස් සහ කුඩා කණ්ඩායම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පවත්වනු ලබන සියලු ක්‍රිකට් සංචාර, තරඟාවලි, තරඟ මාලාව සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා කිරීම, සම්බන්ධීකරණය කිරීම, සැකසුම සහ පරිපාලනය කිරීම සිදු කරනු ලැබිය යුතු ය;

(ඉ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අදාළ දෙපාර්තමේන්තු, අංශ, ඒකක හා නිලධරයන් සහ සේවානියුක්තයන් හරහා මණ්ඩලයේ යෝජනා සම්මතයන් සහ විධානයන් ක්‍රියාවේ යෙදවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය;

(ඊ) සාමාජිකත්වයට අදාළ තොරතුරු සහ ලේඛනගත කිරීම් ඇතුළුව ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජික නාමලේඛන පවත්වා ගැනීම සහ පවත්වා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය;

(උ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකු විසින් යෝග්‍යතා හෝ නියාමන නියමයන්ට අනුකූල නොවීම හෝ කඩකිරීම සිදු කර ඇති යම් අවස්ථාවක් පිළිබඳව මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු ය;

(ඌ) ඩිජිටල් වත්කම්, බුද්ධිමය දේපළ, දත්ත, මාධ්‍ය අයිතිවාසිකම් සහ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික හෝ අතථ්‍ය වත්කම් ඇතුළුව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත අයත් වන සහ පැවරී ඇති සියලු චංචල සහ නිශ්චල දේපළ සහ සියලු ස්පර්ශ්‍ය සහ අස්පර්ශ්‍ය වත්කම්, භාරයේ තබා ගැනීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීමට වගකිව යුතු ය;

(එ) ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබෙන සහ එය විසින් වියදම් කරනු ලබන සියලු මුදල්වලට, ඒ ලැබීම් සහ වියදම් සිදුවන ආකාරය සම්බන්ධයෙන් වන සියලු කාරණාවලට සහ ශ්‍රී ලංකා ක්‍රිකට්හි වත්කම් සහ

බැරකම්වලට සහ සියලු මූල්‍යමය කටයුතු, ගනුදෙනු, එකඟතා සහ ශ්‍රී ලංකා ක්‍රිකට්හි මූල්‍ය තත්ත්වය පිළිබඳව සැබෑ සහ සාධාරණ දැක්මක් පෙන්වීමට අවශ්‍ය වෙනත් කාරණාවලට අදාළව ගිණුම්, වාර්තා, ලේඛන සහ තොරතුරු නිසි පරිදි පවත්වාගෙන යාම සහතික කරනු ලැබිය යුතු ය;

(ඡ) මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් කිසිවකුත් නොමැති අවස්ථාවක, යම් ජාත්‍යන්තර ක්‍රීඩා මණ්ඩලයක්, රාජ්‍ය අධිකාරියක් හෝ වෙනත් යම් ආයතනයක් සමඟ යම් ජාත්‍යන්තර සංසදයක දී, සමුළුවක දී, රැස්වීමක දී, සාකච්ඡාවක දී හෝ නිරත වීමක දී ශ්‍රී ලංකා ක්‍රිකට් නියෝජනය කරනු ලැබිය යුතු ය;

(ඹ) අනුමතය සඳහා මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට්හි වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සහ එකී අනුමත වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා ක්‍රිකට්හි වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන බවට සහතික කරනු ලැබිය යුතු ය; සහ

(ඕ) මණ්ඩලය විසින්, කලින් කල, පවරනු ලැබිය හැකි එකී වෙනත් කාර්යය සහ කර්තව්‍ය කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධාරියා විසින්, මේ පනත මඟින් ඔහු වෙත ප්‍රදානය කරන ලද හෝ ඔහු මත පනවන ලද හෝ ඔහුට පවරන ලද යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් නිලධාරියකුට හෝ සේවානියුක්තයකුට පවරා දීම අවශ්‍ය බවට ඔහු විසින් සලකනු ලබන ඕනෑම අවස්ථාවක, මණ්ඩලයේ අනුමතය සහිතව එලෙස පවරා දෙනු ලැබිය හැකි අතර එම නිලධරයා හෝ සේවානියුක්තයා විසින් ප්‍රධාන විධායක නිලධරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව එම බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා විසින්,-

(අ) සියලු මහා සභා රැස්වීම්, මණ්ඩලයේ රැස්වීම් සහ මේ පනත යටතේ පත් කරන ලද යම් කමිටුවක හෝ අනුකමිටුවක රැස්වීම් නිසි පරිදි කැඳවීම, සහතික කරනු ලැබිය යුතු අතර එහි දී, මණ්ඩලයේ සභාපතිවරයාගේ අධිකාරයට අගති විරහිතව එහි කටයුතු නියාමනය කිරීම සඳහා ස්වකීය කාර්ය ඉටු කිරීමට, නියමිත පරිදි එකී රැස්වීම්වලට සහභාගි විය යුතු ය;

(ආ) මණ්ඩලයේ සහ කමිටුවල හෝ අනුකමිටුවල සියලු රැස්වීම්වල නිවැරදි වාර්තා, නිසි පරිදි වාර්තාගත කිරීම, පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සහ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සියලු වාර්තා, ලේඛන සහ ලියවිලි, මණ්ඩලය විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි එවැනි ආකාරයකින් පවත්වාගෙන යාම සහතික කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) මේ පනත යටතේ සාදන ලද රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි එවැනි කාල රාමුව තුළ මණ්ඩලයේ සහ කමිටුවල හෝ අනුකමිටුවල රැස්වීම්වල දැන්වීම්, න්‍යාය පත්‍ර සහ වාර්තා, ශ්‍රී ලංකා ක්‍රිකට්හි අදාළ සාමාජිකයන්ට සහ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට නිකුත් කිරීම සහ බෙදා හැරීම සහතික කරනු ලැබිය යුතු ය.

අනුකූලතා නිලධාරියා

**39.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරක් දරනු ලැබිය යුතු වූ ද, ඍජුව ම මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු වූ ද, ශ්‍රී ලංකා ක්‍රිකට් කාර්ය මණ්ඩලයේ අනුකූලතා නිලධරයකු, ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත සිටිනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම වාර්ෂික වාර්තාවක ම මේ පනත යටතේ වන සියලු නෛතික නියමයන් සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට් අනුකූල වී ඇති බව සහතික කිරීමට, අනුකූලතා නිලධාරියාහට නියම කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයන් හා සේවානියුක්තයන් ආදිය

**40.** (1) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අනුමත කළ සංවිධානාත්මක ව්‍යුහය, අයවැය සහ අදාළවන ප්‍රතිපත්තීන් හා කාර්යපටිපාටින්වලට යටත්ව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය විසින් සලකනු ලබන, ස්ථිර, තාවකාලික, තත්කාර්ය සහ ස්ථාවර කාලීන සේවක සංඛ්‍යා තනතුරු ඇති කිරීම සහ ස්ථිර, තාවකාලික, ස්ථාවර කාලීන, කොන්ත්‍රාත් පදනම් මත, අර්ධකාලීන, අනියම්, ඍතුමය, ව්‍යාපෘති පාදක හෝ උපදේශන පදනම යන කවර ආකාරයෙන්වූ ව ද, ඒ නිලධරයන්, සේවානියුක්තයන්, අනුශාසකයන්, උපදේශකයන් සහ වෙනත් සේවක පිරිස්, සේවානියුක්ත කිරීම හෝ පත් කිරීම මණ්ඩලය විසින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් මේ පනත යටතේ සාදන ලද රීති ආකාරයෙන්, -

(අ) එම නිලධරයන්ගේ, සේවානියුක්තයන්ගේ, අනුශාසකයන්ගේ, උපදේශකයන්ගේ සහ වෙනත් සේවක පිරිසකගේ සේවා නියම සහ කොන්දේසි සැකසීම;

(ආ) එම නිලධරයන්ගේ, සේවානියුක්තයන්ගේ අනුශාසකයන්ගේ, උපදේශකයන්ගේ සහ වෙනත් සේවක පිරිසකගේ චර්යා සංග්‍රහ පිළියෙල කිරීම; සහ

(ඇ) එම නිලධරයන්ට, සේවානියුක්තයන්ට, අනුශාසකයන්ට, උපදේශකයන්ට සහ වෙනත් සේවක පිරිසට ගෙවිය යුතු වැටුප්, දීමනා සහ ප්‍රතිලාභ නිශ්චිතව දැක්වීම,

සිදු කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු, අනුශාසකවරයකු, උපදේශකයකු හෝ වෙනත් සේවකයකු ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් සාමාජිකයකුගේ ධුර දරන්නකු නොවිය යුතු ය.

(4) ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයකු හෝ සේවානියුක්තයකු අනුශාසකවරයකු, උපදේශකයකු හෝ වෙනත් සේවකයකු වීම හේතුවෙන්, තැනැත්තකු යටත් විය හැකි යම් නෛතික හෝ වෙනත් බැඳීයාවක් නොතකා, දූෂණය පිළිබඳ යම් ක්‍රියාවකට හෝ යම් වරදක් සිදු කිරීමකට සාධාරණ විය හැකි සම්බන්ධයක් දක්වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් තොරතුරක් මුදා හැරීම හෝ හෙළිදරව් කිරීම සඳහා, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ අනුශාසකවරයකු, උපදේශකයකු හෝ වෙනත් සේවකයකු යම් විනයානුකූල හෝ අනාායාකාර දඬුවමකට යටත් කරනු නොලැබිය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

ක්‍රීඩා පනත අභිබවා මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු බව

**41.** (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට සහ ඉන්පසුව, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ක්‍රීඩා පනතේ විධිවිධාන බල නොපැවැත්විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන සහ ක්‍රීඩා පනතේ විධිවිධාන අතර යම් ගැටුමක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

වාර්ෂික වාර්තා

**42.** (1) මණ්ඩලය විසින්, අදාළ මූල්‍ය වර්ෂය තුළ මේ පනත යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක්, එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස හයක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව තුළ පහත දැක්වෙන ලේඛන ඇතුළත් කරනු ලැබිය යුතුය:-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ වර්ෂය සඳහා වන විගණනය කරන ලද ගිණුම්;

(ආ) එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක්;

(ඈ) පසුගිය ගිණුම්කරණ කාලසීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතුවල තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක්;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි මණ්ඩලයේ සියලු ස්වාධීන අධ්‍යක්ෂවරයන්ගේ සහ තෝරා පත් කර ගන්නා ලද අධ්‍යක්ෂවරයන්ගේ සහ කමිටුවල සහ අනුකමිටුවල සාමාජිකයන්ගේ නම් සහ සුදුසුකම් සහ පැමිණීම පිළිබඳ විස්තර;

(ඉ) අදාළ වාර්තාකරන කාලසීමාව තුළ භාර ගන්නා ලද ක්‍රියාකාරකම්, ගනු ලබන තීරණ, සලකා බලන ලද කාරණා සහ මණ්ඩලය විසින් ප්‍රමාණාත්මක හෝ වැදගත් යයි සලකන සහ හෙළිදරව් කිරීමට අවශ්‍ය කරන තීරණ, ක්‍රියාත්මක කිරීම ඇතුළුව මණ්ඩලයේ සහ කමිටුවල සහ අනුකමිටුවල බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අයත් කාරණා පිළිබඳ වාර්තා;

(ඊ) ගිණුම්කරණ කාලසීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට්හි මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයන්ගේ සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන්ගේ සහ කමිටුවල සහ අනුකමිටුවල සියලු සාමාජිකයන්ගේ පාරිශ්‍රමික සහ සියලු ප්‍රතිලාභ පිළිබඳ විස්තර; සහ

(උ) ගිණුම්කරණ කාලසීමාව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත සිදු කරන ලද සහ ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සිදු කරන ලද මුළු පරිත්‍යාග ප්‍රමාණය.

(2) මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ, කමිටුවේ සහ අනුකමිටුවේ සාමාජිකයන්ගේ රක්ෂණ ප්‍රතිලාභ

**43.** ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයකු සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවානියුක්තයකු හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි කමිටුවල සහ අනුකමිටුවල සාමාජිකයකු විසින් ස්වකීය නිල කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් එකී තැනැත්තාට එරෙහිව ගෙන එන ලද යම් නීති කටයුත්තක දී ,එකී තැනැත්තා -

(අ) අවංකව සහ සද්භාවයෙන් ක්‍රියා කර ඇති විටක;

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යහපත සඳහා බවට ඔහු විසින් සාධාරණ ලෙස විශ්වාස කරන ලද ආකාරයකට ක්‍රියා කරන ලද විටක;

(ඇ) මේ පනතේ විධිවිධාන, අදාළ ලිඛිත නීති සහ පාලන ප්‍රතිපත්ති සමඟ අනුකූලව ක්‍රියා කරන ලද විටක; සහ

(ඈ) යම් අනිසි පෞද්ගලික ප්‍රතිලාභයක් ලබා නොගෙන ඇති විටක,

එකී අධ්‍යක්ෂවරයා, නිලධරයා, සේවානියුක්තයා හෝ සාමාජිකයා විසින් එකී නීති කෘත්‍යයේ දී දරන ලද සියලු ඉල්ලීම්, ගාස්තු සහ වියදම්වලට එරෙහිව ශ්‍රී ලංකා ක්‍රිකට්හි සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයකු ම සහ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවානියුක්තයකු හෝ ශ්‍රී ලංකා ක්‍රිකට්හි කමිටුවල සහ අනුකමිටුවල සාමාජිකයකු ආරක්ෂා කිරීමට, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි, එකී සීමාවන්ට යටත්ව සුදුසු අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධරයන්ගේ රක්ෂණ ප්‍රතිපත්තියක් පවතින බවට ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

**44.** (1) අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි දේපළ හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු, ඔහු විසින් නියම කළ හැකි එවැනි ආකෘතියකින්, ලිඛිතව, ඔහු වෙත සැපයීමට ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත, කලින් කල, නියම කරනු ලැබිය හැකි ය. එකී විධාන සමඟ අනුකූලවීම ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්යය විය යුතු ය. අමාත්‍යවරයාගේ අධීක්ෂණය

(2) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සුපිළිපන්භාවයට, පාලනයට හෝ පරිපාලනයට අගතිගාමී වන, දූෂණයක්, වංචාවක්, මූල්‍ය අක්‍රමිකතාවක් හෝ වෙනත් කටයුත්තක් සම්බන්ධයෙන් විශ්වාසනීය චෝදනාවක් පිළිබඳව අමාත්‍යවරයා දැනුවත්වන අවස්ථාවක හෝ ඒ සම්බන්ධයෙන් විශ්වාසනීය තොරතුරක් අමාත්‍යවරයා වෙත ලැබෙන හෝ ඒ පිළිබඳ අමාත්‍යවරයාට දැනුම් දෙනු ලබන අවස්ථාවක අමාත්‍යවරයා විසින්, එය අවශ්‍ය යැයි සලකනු ලබන විටක, ලිඛිත විධානයක් මඟින් -

(අ) එකී කාරණය සම්බන්ධයෙන් විගණනයක් පැවැත්වීමට සහ එකී විධානයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් තුළ අමාත්‍යවරයාට වාර්තා කිරීමට විගණකාධිපතිවරයා වෙත නියම කිරීම; හෝ

(ආ) කාරණය, අදාළ ලිඛිත නීතියට අනුකූලව විමර්ශනය කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා සුදුසු නීතිය බලාත්මක කිරීමේ බලධරයකුට හෝ වෙනත් නිසි බලධරයකුට යොමු කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයාට සිදු කරන ලද පැමිණිල්ලක් මත, ලබා දෙන ලද විශ්වාසනීය තොරතුරක් මත හෝ අන්‍යාකාරයකින් ඔහුට දැනුම් දෙන ලද විශ්වාසනීය තොරතුරක් මත, ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිසි පාලනයට, පරිපාලනයට හෝ මූල්‍ය කළමනාකරණයට අගතිදායක වන්නා වූ ද ශ්‍රී ලංකා ක්‍රිකට්හි හෝ මණ්ඩලයේ යම් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගන්නා ලද අධ්‍යක්ෂවරයකුගේ හෝ මණ්ඩලයේ පාර්ශ්වයෙන් සිදුවන්නා වූ ක්‍රිකට් ක්‍රීඩාවේ සුපිළිපන්භාවයට අදාළ වන හෝ බලපෑම් කරන යම් කාරණයක්, යම් දූෂණයක්, යම් අයථා මූල්‍ය කළමනාකරණයක් හෝ අක්‍රමිකතාවක්, භාරකාර කාර්යය පිළිබඳ බරපතළ කඩකිරීමක්, විෂමාචාරයක් හෝ වෙනත් යම් චර්යාවක් පවතින බවට විශ්වාස කිරීමට අමාත්‍යවරයා සතුව සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, අවස්ථානුගත කරුණු අනුව ඔහු විසින් අවශ්‍ය බවට සලකනු ලබන්නේ නම්, එකී කාරණාව පිළිබඳ මූලික විමර්ශනයක් පැවැත්වීමට සහ අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි එවැනි කාලසීමාවන් තුළ අමාත්‍යවරයා වෙත වාර්තා කිරීමට අමාත්‍යවරයා විසින් අවශ්‍ය යැයි සැලකෙන පරිදි එකී නිපුණතාවය, සුදුසුකම් සහ අත්දැකීම් සහිත සාමාජිකයන් තිදෙනකුගේ ආරම්භක කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුවේ වාර්තාව සලකා බැලීමෙන් පසුව හෝ අමාත්‍යවරයා විසින් විධිමත්

පරීක්ෂණයක් අවශ්‍ය බවට අදහස් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වන ලද කාරණා පිළිබඳ පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විශ්‍රාමික විනිසුරුවරයාගේ වාර්තාව හෝ (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබීමෙන් පසුව, අදාළ මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු හෝ අදාළ මණ්ඩලය ඉවත් කිරීම, අත්හිටුවීම හෝ කර්තව්‍ය තහනම් කිරීම සම්බන්ධයෙන් එහි අඩංගු නිර්දේශ, සොයා දැනගත් කරුණු හෝ තීරණවලට අනුව හෝ අනුකූලව අමාත්‍යවරයා විසින් එකී ක්‍රියාමාර්ගය ගනු ලැබිය හැකි අතර ඉන් අනතුරුව, මේ පනතට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ අලුත් ස්වාධීන අධ්‍යක්ෂවරයකු හෝ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයකු හෝ නව මණ්ඩලයක් තෝරා පත් කර ගැනීම හෝ පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය හැකි ය.

(6) ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිලධරයන්, සේවානියුක්තයන් සහ සාමාජිකයන් විසින්, මේ වගන්තිය යටතේ වන යම් විගණනයක, විමර්ශනයක හෝ පරීක්ෂණයක කාර්ය සඳහා සියලු පොත්, ගිණුම්, වාර්තා, ලේඛන, ඉලෙක්ට්‍රොනික දත්ත, තොරතුරු සහ පැහැදිළි කිරීම් සැපයීම මඟින් සහ සාධාරණ ලෙස නියම කරන ලද හැකි ස්වකීය පරිශ්‍රවලට ප්‍රවේශය, පහසුකම් සහ තැනැත්තන් ලබා දීම මඟින් ඇතුළු පූර්ණ සහ කඩිනම් සහාය ලබා දෙන බවට ශ්‍රී ලංකා ක්‍රිකට් සහතික විය යුතු ය.

**45.** (1) මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීමක දී, මේ පනත යටතේ සාදනු ලැබීමට නියමිත හෝ සාදනු ලැබීමට බලය ලබා දෙන ලද රීති සඳහා වන සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු අතර, එම රීති සභාපතිවරයා සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු ඇතුළුව, යෝජිත රීති වෙනුවෙන් සහය දක්වමින් ඡන්දය ලබාදෙන සියලුම අධ්‍යක්ෂවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට වඩා අඩු නොවන ඡන්දයෙන් අනුමත කළ යුතු ය. රීති

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද රීති, කලින් කල, එවැනි රැස්වීමක දී, එවැනි ආකාරයකින්, සංශෝධනය කිරීම, මද වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම සිදු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 35 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වත්මන් මණ්ඩලය විසින් සාදන ලද රීති 35 වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට යටත්ව සංශෝධනය කිරීම, මද වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක් ම, ශ්‍රී ලංකා ක්‍රිකට්හි වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු අතර 27 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට්හි නිල වර්ණ සහ නිල ලාංඡනය සම්බන්ධයෙන් සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) ගැසට් පත්‍රයේ පළ කරන ලද සෑම රීතියක් ම, එම රීති ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත, එහි අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එලෙස අනුමත නොකරන ලද එකී යම් රීතියක්, ඒ යටතේ නිසි පරිදි සිදු කරන ලද යම් දෙයකට අගතියකින් තොරව, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ මෙන් සලකනු ලැබිය යුතු ය.

(5) රීතියක්, එලෙස පරිච්ඡින්න කරනු ලැබූමෙන් සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**46.** මේ පනතේ, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,-

"ආසියානු ක්‍රිකට් සභාව" යන්නෙන්, ආසියාවේ ක්‍රිකට් සඳහා වන කලාපීය පාලක මණ්ඩලය අදහස් වන අතර ඊට යම් අනුප්‍රාප්තික මණ්ඩලයක් ද ඇතුළත් වේ;

"ඉදිකිරීම්-මෙහෙයුම්-පැවරීමේ විධිවිධාන" යන්නෙන්, එකඟ වන ලද කාලපරිච්ඡේදයක් සඳහා යම් පහසුකමකට, යටිතල පහසුකමකට හෝ වෙනත් වත්කමකට මුදල් සැපයීමට, සැලසුම් කිරීමට, ගොඩනැගීමට, සංවර්ධනය කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට යම් තැනැත්තකුට හෝ අස්ථිත්වයකට බලය ලබා දීම යටතේ පසුව එම පහසුකම, යටිතල පහසුකම හෝ වෙනත් වත්කමක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත පවරා දීම හෝ අන්‍යාකාරයකින්, වැඩ පිළිවෙළෙහි නියමවලට අනුකූලව කටයුතු කරනු ලබන්නා වූ, ශ්‍රී ලංකා ක්‍රිකට්හි පරමාර්ථ ඉටු කර ගැනීම සමඟ ඍජුව සම්බන්ධ වන යම් පහසුකම්, යටිතල පහසුකම් හෝ වෙනත් වත්කමක් සංවර්ධනය කිරීමට හෝ ස්ථාපනය කිරීමට අදාළ වැඩපිළිවෙළක් අදහස් වේ;

"ආයතනික සමාජ වගකීම" යන්නෙන්, ක්‍රිකට්හි සංවර්ධනය සහ එහි ප්‍රවේශ්‍යතාව ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාව පුරා ප්‍රජාවන්ගේ ශුභ සාධනයට සහ සංවර්ධනයට දායක වීමට අපේක්ෂිත මූලාරම්භකයන් ඇතුළුව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි පරමාර්ථවලට සම්බන්ධවන්නා වූ, ආනුෂංගික වන්නා වූ හෝ සහාය වන්නා වූ සමාජ වගකීම, පුණ්‍යාධාර, අධ්‍යාපනික, සංස්කෘතික සහ පාරිසරික සමානාත්මතාව, ඇතුළත් බව, විවිධත්වය, තරුණ සංවර්ධනය සහ සමාජ ශුභ සාධන මූලාරම්භකයන්, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් භාර ගැනීම්, සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම අදහස් වේ;

"දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ අදාළ දිස්ත්‍රික්කයක් තුළ ක්‍රිකට් පරිපාලනය, ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පිහිටුවන ලද නිසි ලෙස පිළිගත් ක්‍රිකට් සංගමයක් අදහස් වේ;

"මහා සභා රැස්වීම" යන්නෙන්, මේ පනතට අනුකූලව නිසි ලෙස කැඳවන ලද ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් වාර්ෂික මහා සභා රැස්වීමක් හෝ විශේෂ මහා සභා රැස්වීමක් අදහස් වේ;

"ආණ්ඩුකාර කුසලාන තරඟාවලිය" යන්නෙන්, තරඟාවලි ව්‍යුහයට අනුකූලව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එම නාමයෙන් ව්‍යුහගත කර, සංවිධානය කර, පවත්වන ලද ක්‍රිකට් තරඟාවලිය අදහස් වේ;

"බුද්ධිමය දේපළ අයිතිවාසිකම්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ නීති යටතේ හෝ වෙනත් යම් අධිකරණ බල ප්‍රදේශයක් යටතේ පවතින්නා වූ, ලියාපදිංචි කළ හෝ නොකළ, වෙළඳ ලකුණු, සේවා ලකුණු, වෙළඳ නාම, ලාංඡන, නිල ලාංඡන, ප්‍රකාශන අයිතිවාසිකම්, විකාශන අයිතිවාසිකම්, ඩිජිටල් අයිතිවාසිකම්, රූප අයිතිවාසිකම්, ජනමාධ්‍ය අයිතිවාසිකම්, පේටන්ට් බලපත්‍ර, සැලසුම්, ඩොමේන් නාම, දත්ත අයිතිවාසිකම් සහ වෙනත් සියලු හිමිකාර අයිතිවාසිකම් ඇතුළුව කවර හෝ ස්වභාවයේ සියලු ම බුද්ධිමය දේපළ අයිතිවාසිකම් අදහස් වේ;

"ජාත්‍යන්තර ක්‍රිකට් සභාව" යන්නෙන්, ක්‍රිකට් සඳහා වන ජාත්‍යන්තර පාලන මණ්ඩලය අදහස් වන අතර ඊට යම් අනුප්‍රාප්තික මණ්ඩලයක් ද ඇතුළත් වේ;

"ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ" යන්නෙන් ජාත්‍යන්තර එක් දින ක්‍රිකට් තරඟයක්, ටී20 ජාත්‍යන්තර ක්‍රිකට් තරඟයක් සහ ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් තරඟයක් අදහස් වේ;

"ක්‍රිකට් නීති" යන්නෙන්, ජාත්‍යන්තර ක්‍රිකට් සඳහා මැරිලිබෝන් ක්‍රිකට් සමාජය (එම්සීසී) විසින්, කලින් කල, පළ කරන ලද සහ සංශෝධනය කරන ලද සහ ජාත්‍යන්තර ක්‍රිකට් සභාව විසින් සම්මත කරන ලද හෝ වෙනස් කරන ලද ක්‍රිකට් නීති අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ක්‍රීඩා විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ ජාතික ක්‍රීඩා සංගමය" යන්නෙන්, මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ක්‍රිකට්

ක්‍රීඩාව සඳහා ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය ප්‍රකාර ලියාපදිංචි කරන ලද ජාතික ක්‍රීඩා සංගමය අදහස් වේ;

“ජාතික සංචිතය” යන්නෙන්, මණ්ඩලය විසින් පවත්වන ලද හෝ අනුමත කරන ලද ජාතික පුහුණු වැඩසටහන්, කඳවුරු, තක්සේරු කිරීම් හෝ වෙනත් සූදානම්වීමේ ක්‍රියාකාරකම්වල සහභාගි වන්නා වූ ක්‍රීඩකයන් ඇතුළුව, යම් ජාතික කණ්ඩායමකට තෝරා ගැනීම සඳහා සලකා බැලීම සඳහා සුදුසු බවට මණ්ඩලය විසින් හඳුනාගන්නා ලද, තෝරාගන්නා ලද, ගිවිසුම්ගත වන්නා ලද හෝ අන්‍යාකාරයකින් නම් කරන ලද ක්‍රීඩකයන් කණ්ඩායමක් අදහස් වේ;

“ජාතික කණ්ඩායම” යන්නෙන්, අයිසීසී විසින්, යම් අයිසීසී සාමාජිකයකු විසින් හෝ වෙනත් යම් පිළිගත් ක්‍රිකට් මණ්ඩලයක් විසින්, පවත්වන ලද හෝ අනුමත කරන ලද, යම් ජාත්‍යන්තර ක්‍රිකට් තරඟයක, තරඟ මාලාවක, තරඟාවලියක, තරඟයක හෝ වෙනත් ක්‍රිකට් ඉසව්වක, ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට ජාතික පිරිමි කණ්ඩායම, ජාතික කාන්තා කණ්ඩායම සහ වෙනත් යම් ජාතික නියෝජන කණ්ඩායමක් හෝ වර්ගයක් ඇතුළුව මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද, නම් කරන ලද හෝ අන්‍යාකාරයකින් නම් කළ යම් ක්‍රීඩකයන්ගේ කණ්ඩායමක් අදහස් වේ;

“ධුර දරන්නා” යන්නෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් සාමාජිකයකුගේ අධිකාරි බලය හෝ වගකීම පිළිබඳ පිළිගත් තනතුරක් දරන්නා වූ සභාපතිවරයා, උපසභාපතිවරයා, ලේකම්, උපලේකම්වරයා, භාණ්ඩාගාරික, උපභාණ්ඩාගාරික හෝ වෙනත් තෝරා පත් කර ගන්නා ලද හෝ පත් කරන ලද ධුර දරන්නකු අදහස් වේ;

“පළාත් ක්‍රිකට් සංගමය” යන්නෙන්, ශ්‍රී ලංකාවේ අදාළ පළාත තුළ ක්‍රිකට් පරිපාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා

පිහිටුවන ලද නිසි ලෙස පිළිගනු ලැබූ පළාත් ක්‍රිකට් සංගමයක් අදහස් වේ;

"තරඟ සමය" යන්නෙන්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නිශ්චය කරනු ලැබිය හැකි එම දිනයේ දී ආරම්භ වන්නා වූ ද, අදාළ කාල පරිච්ඡේදය සඳහා තරඟාගාවලි ව්‍යුහය යටතේ සැලසුම් කරන ලද සියලු තරඟාවලි සම්පූර්ණ වීමෙන් සහ අවසන් වීමෙන් පසුව අවසන් වන්නා වූ ද කාල පරිච්ඡේද අදහස් වේ;

"විශේෂ මහා සභා රැස්වීම" යන්නෙන්, මේ පනතට අනුකූලව කැඳවන ලද වාර්ෂික මහා සභා රැස්වීම හැර, ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක් අදහස් වේ;

"ක්‍රීඩා නගර සංකල්පය" යන්නෙන්, ක්‍රීඩාව කේන්ද්‍ර කරගත් එකිනෙකට සම්බන්ධිත වූ බහුවිධ පහසුකම්වලින් සහ වාණිජ, අධ්‍යාපන, නේවාසික, විනෝදාත්මක සහ සංචාරක කටයුතුවලට ආශ්‍රිත සංරචකවලින් සමන්විත ඒකාබද්ධ ක්‍රීඩා පරිශ්‍රයක් සංවර්ධනය කිරීම ඇතුළත් විය යුතු ය. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් වන විට, ඊට පුහුණු වීමේ සහ ඉහළ මට්ටමේ පහසුකම්, ශාස්ත්‍රාල, ක්‍රීඩා විද්‍යා සහ වෛද්‍ය මධ්‍යස්ථාන, ක්‍රීඩකයන්ගේ නවාතැන් පහසුකම්, ක්‍රීඩා අධ්‍යයන සහ පර්යේෂණ පහසුකම්, ක්‍රීඩා භාණ්ඩ අලෙවිසල් සහ සත්කාරක සේවා, ක්‍රීඩා සංචාරක පහසුකම්, කාර්යාල සහ වාණිජ අවකාශයන්, විනෝද වීම සඳහා වන පොදු පරිශ්‍ර සහ සහායක යටිතල පහසුකම් සහිත ප්‍රධාන ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හෝ ක්‍රීඩා භූමි ඇතුළත් විය යුතු ය;

"ක්‍රීඩා පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත අදහස් වේ;

"ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව" යන්නෙන්, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් වන ජාතික ක්‍රීඩා සංගමයේ

කර්තව්‍ය අඛන්ඩව කරගෙන යාම සඳහා අතුරු වැඩපිළිවෙළක් වශයෙන් ක්‍රීඩා පනතේ 33 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව අදහස් වේ.

## VIII කොටස

### අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන

**47.** (1) පූර්වගාමී මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වීම නතර විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පූර්වගාමී මණ්ඩලය සතුව පවත්නා සියලු වත්කම් සහ බැරකම්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි වත්කම් සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා සහ පූර්වගාමී මණ්ඩලය විසින් හෝ ඒ සමඟ එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා හෝ අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද යම් ලේඛනයක්, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් හෝ ඒ සමඟ එළඹෙන ලද ගිවිසුම් සහ එකඟතා, අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද ලේඛන ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී විභාගවෙමින් පවතින්නා වූ ද, පූර්වගාමී මණ්ඩලය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද, සියලු නඩු, නීති කෘත්‍යය හෝ නඩු පැවරීම්, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු, නීති කෘත්‍යය හෝ නඩු පැවරීම් ලෙස සලකනු ලැබිය යුතු අතර ඊට අනුකූලව අඛණ්ඩව ක්‍රියාත්මක වනු ලැබිය හැකි ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී නොවිසඳී පවතින්නා වූ ද, පූර්වගාමී මණ්ඩලය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් එළඹෙන ලද හෝ සිදු කරන ලද සියලු තීන්දු ප්‍රකාශ සහ තීරණ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා ක්‍රිකට් වෙනුවෙන් හෝ ඊට එරෙහිව එළඹෙන ලද හෝ සිදු කරන ලද තීන්දු ප්‍රකාශ හෝ තීරණ ලෙස සලකනු ලැබිය යුතු අතර ඊට අනුකූලව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ඉ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ, පූර්වගාමී මණ්ඩලයේ එකී දේපළ හෝ ව්‍යාපාරවලින් උද්ගත වන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ බැඳියාවන්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි දේපළ හෝ ව්‍යාපාරවලින් උද්ගත වන අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ බැඳියාවන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සේවය කරන්නා වූ ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව පූර්වගාමී මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරවන ලද්දා වූ ද, කාර්ය මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සේවානියුක්තයන් සහ වෙනත් තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන්ට අදාළ වන්නා වූ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන එකී නියම සහ කොන්දේසි මත ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සේවයේ නියුක්ත කරවනු ලබන්නා සේ සැලකිය යුතු ය.

(උ) මේ පනතේ, අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා නොමැති නම් මිස, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වන දිනයේ දී,-

(i) පූර්වගාමී මණ්ඩලය විසින් නීත්‍යානුකූලව සාදන ලද්දා වූ ද, ක්‍රියාත්මක වීම හෝ

අනුමතය බලාපොරොත්තු වන්නා වූ ද සියලු පත් කිරීම්, නම් කිරීම් සහ බලය පවරා දීම්;

(ii) අවසන් කිරීමට බලාපොරොත්තු වන්නා වූ, පූර්වගාමී මණ්ඩලයේ සියලු විනය කටයුතු, විමර්ශන, විනය සම්බන්ධ අභියාචනා සහ වෙනත් පරිපාලන හෝ නියාමන කටයුතු; සහ

(iii) සම්පූර්ණ නොකර පවතින සියලු තරඟාවලි සහ තරඟ,

එකී ක්‍රියාත්මක වීම, අනුමතය, අවසන් කිරීම හෝ සම්පූර්ණ කිරීම මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට, අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, අනුමත කිරීම, අවසන් කිරීම හෝ සම්පූර්ණ කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(3) 9 වන වගන්තියේ (5) වන උපවගන්තිය අනුව පළමුවන මණ්ඩලයේ ධුර කාලය ආරම්භවන තෙක් වත්මන් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට්හි සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු අතර ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ කටයුතු පාලනය කිරීමට, කළමනාකරණය කිරීමට සහ පරිපාලනය කිරීමට සම්පූර්ණ බලය සහ අධිකාරය වත්මන් මණ්ඩලය සතු විය යුතු ය.

(4) වත්මන් මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මක වන දිනට පසුව පවත්වනු ලබන එහි රැස්වීම්වල දී, මේ පනතේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා ක්‍රිකට්හි පළමු මණ්ඩලය පත් කරනු ලබන තෙක්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු සහ කර්තව්‍ය පිළිබඳ නිසි පාලනය, පරිපාලනය සහ නියාමනය සඳහා අවශ්‍ය විය හැකි පහත කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය :-

(අ) නිල වර්ණ සහ නිල ලාංඡනය;

(ආ) වත්මන් මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීම්;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි තරඟාවලි ව්‍යුහය;

(ඈ) වාර්ෂික මහා සභා රැස්වීමේ දැන්වීම් සහ න්‍යාය පත්‍රය සහ වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම සහ ඊට අදාළ කාරණා;

(ඉ) වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී පළමු මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරුන් හත්දෙනා තෝරා පත් කර ගැනීම සඳහා වන තෝරා පත්කර ගැනීමේ ක්‍රියාවලිය;

(ඊ) ගෘහාශ්‍රිත ක්‍රිකට් පාලනය, පරිපාලනය සහ තරඟාවලි අධීක්ෂණය;

(උ) විනය කාර්යපටිපාටි;

(ඌ) ආරවුල් සමථ කිරීමේ කාර්යපටිපාටි;

(එ) පිරිමි සහ කාන්තා තේරීම් කමිටු පත්කිරීම සඳහා වන කාර්යපටිපාටිය;

(ඒ) දිස්ත්‍රික් ක්‍රිකට් සංගම්වලට සහ පළාත් ක්‍රිකට් සංගම්වලට අදාළ කාරණා;

(ඔ) මේ පනත යටතේ පත්කරන ලද කමිටු සහ අනුකමිටුවලට අදාළව නිර්ණායක;

(ඕ) නාමයෝජනා කමිටුව පිහිටුවීම සහ ස්වාධීන අධ්‍යක්ෂවරු තෝරා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය;

(ක) ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටිය;

(ග) මහා සභා රැස්වීම්වලට අදාළ කැඳවීම සහ මෙහෙයවීම මෙන්ම වෙනත් ආනුශංගික කාරණා; සහ

(ච) ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු නිසි ලෙස පාලනය සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කාරණා.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**48.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

**(2 වන, 4 වන සහ 29 වන වගන්ති)**

**ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් වර්ග, සුදුසුකම් ලැබීමේ නිර්ණායක සහ නියම සහ කොන්දේසි**

| I වන තීරය<br>ශ්‍රී ලංකා ක්‍රිකට්හි සාමාජිකයන් වර්ග | II වන තීරය<br>සුදුසුකම් ලැබීමේ නිර්ණායක | III වන තීරය<br>නියම සහ කොන්දේසි |
|---|---|---|
| (1) “ඒ” කාණ්ඩයේ සාමාජිකයකු | (අ) අදාළ සලකා බැලීම සිදු කරන ලබන දිනට පෙර සම්පූර්ණ කරන ලද අවසන් තරඟ සමය අවසානයේ දී 35 වන වගන්තියේ සඳහන් තරඟාවලි ව්‍යුහයට අනුකූලව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන සහ පවත්වනු ලබන “ඒ” කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියකට සහභාගි වීමට ක්‍රීඩා සමාජයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවක, එකී ක්‍රීඩා සමාජය ශ්‍රී ලංකා ක්‍රිකට්හි “ඒ” කාණ්ඩයේ සාමාජිකයකු ලෙස පිළිගනු ලැබිය යුතු ය; | යම් “ඒ” කාණ්ඩයේ සාමාජිකයකු:-<br><br>(අ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි ප්‍රමුඛතම සාමාජිකත්ව වර්ගයට අයත් විය යුතු ය;<br><br>(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය;<br><br>(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී ඡන්ද දෙකක් ලබා දීමට හිමිකම් ලැබිය යුතු ය; |

නිදර්ශනය

*යම් වර්ෂයක අදාළ සලකා බැලීම සිදු කරනු ලබන දිනය ජුනි මස පළමුවන දින වේ. ඒ දිනය වන විට, "බී" කාණ්ඩයේ තරඟාවලිය තරඟ කරනු ලැබූ "එක්ස්" ක්‍රීඩා සමාජය එකී තරඟාවලිය අවසානයේ දී ඊළඟ තරඟ සමය සඳහා "ඒ" කාණ්ඩයට උසස් කිරීමට හිමිකම් ලබා ඇත. එසේ වුව ද, "ඒ" කාණ්ඩයේ තරඟවලිය තවමත් සම්පූර්ණ කර නොමැති සහ, "ඒ" කාණ්ඩයේ සිට "බී" කාණ්ඩයට දක්වා පහත හෙළිය යුතු කණ්ඩායමක් ද තවමත් නිශ්චය කර නොමැත. පෙර තරඟ සමය තවමත් සම්පූර්ණ කර නොමැති හෙයින් "එක්ස්" ක්‍රීඩා සමාජය "බී" කාණ්ඩය යටතේ වන බවට සලකනු ලැබිය යුතු ය.*

(ආ) යම් සාමාජිකයකු "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියේ සිට "ඒ" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලිය දක්වා උසස් කරනු ලැබූ අවස්ථාවක, එකී සාමාජිකයා "ඒ" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියකට සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ තරඟ සමයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ සිට පමණක් ඊට අදාළ ඡන්දය දීමේ අයිතිවාසිකම් ද ඇතිව "ඒ" කාණ්ඩයේ සාමාජිකයෙකු ලෙස පිළිගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය;

(ඇ) අදාළ සලකා බැලීම සිදුකරනු ලබන දිනයේ දී, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන, පවත්වනු ලබන සහ අනුමත කරනු ලබන "ඒ" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියට සහභාගිවන්නකු විය යුතු ය;

(ඉ) පාලනයෙහි, ගිණුම්කරණයෙහි, පරිපාලනයෙහි, සහ ක්‍රිකට් මෙහෙයුම්හි නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඊ) සෑම විටක දී ම සාමාජිකයන් දෙසිය දෙනකුගෙන් යුතු අවම ලියාපදිංචි සාමාජික සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් යම් සමාලෝචනයක් හෝ සත්‍යායතනයක් කරනු ලැබූ විට, මේ නියමයට අනුකූලව කටයුතු කර ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් "ඒ" කාණ්ඩයේ සාමාජිකයකු විසින් එකී අවම සාමාජික සංඛ්‍යාව පවත්වාගෙන යාමට අපොහොසත් වන අවස්ථාවක,

එකී අවශ්‍යතාවය සම්පූර්ණ කරන තෙක් එකී සාමාජිකයා එක් ඡන්දයක් පමණක් ලබා දීමට හිමිකම් ලැබිය යුතු ය;

එසේ වුව ද, එසේ සුදුසුකම් ලැබීම සඳහා අදාළ තරඟ සමය සඳහා වූ "ඒ" කාණ්ඩයේ තරඟාවලිය අවසන්ව තිබිය යුතු අතර සෑම විටකදීම III වන තීරයේ (ඊ) වන ඡේදයේ දක්වා ඇති අවම සාමාජිකයන් සංඛ්‍යාව පිළිබඳ නිර්ණායකවලට අනුකූලව කටයුතු කර තිබිය යුතු ය

(උ) යම් වර්ෂයක් තුළ, එකී සාමාජිකයා "ඒ" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියට සහභාගි වීමට හිමිකම් ලැබීම අවසන් වූ ඕනෑම අවස්ථාවක, ස්වකීය "ඒ" කාණ්ඩයේ සාමාජික තත්ත්වය සහ ඡන්දය දීමේ අයිතිවාසිකම් අහිමි වීමට යටත් විය යුතු ය.

එකී ඡන්දය දීමේ අයිතිවාසිකම් සහ සාමාජික තත්ත්වය අහිමිවීමෙන් පසු, එකී සාමාජිකයා සහභාගී වන ක්‍රිකට් මට්ටමට අනුරූපී අදාළ සාමාජික වර්ගයට අයත් සාමාජිකයකු ලෙස නැවත නිර්දිෂ්ට කිරීම හෝ නැවත වර්ගීකරණය කිරීම කරනු ලැබිය යුතු ය.

(2) "බී" කාණ්ඩයේ සාමාජිකයකු

(අ) අදාළ සලකා බැලීම සිදු කරනු ලබන දිනට පෙර සම්පූර්ණ කරන ලද අවසන් තරඟ සමය අවසානයේ දී 35 වන වගන්තියේ සඳහන් තරඟාවලි ව්‍යුහයට අනුකූලව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන සහ පවත්වනු ලබන "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියකට සහභාගි වීමට ක්‍රීඩා සමාජයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවක, එකී ක්‍රීඩා සමාජය ශ්‍රී ලංකා ක්‍රිකට්හි "බී" කාණ්ඩයේ සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය යුතු ය; සහ

යම් "බී" කාණ්ඩයේ සාමාජිකයකු:-

(අ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට යටත්ව යම් මහා සභා රැස්වීමක දී එක් ඡන්දයක් ලබාදීමට හිමිකම් ලැබිය යුතු ය;

(ආ) යම් සාමාජිකයකු ආණ්ඩුකාර කුසලාන තරඟාවලියේ සිට "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලිය දක්වා උසස් කරනු ලැබූ අවස්ථාවක, එකී සාමාජිකයා "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියට සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ තරඟ සමයෙන් ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ සිට පමණක් ඊට අදාළ ඡන්දය දීමේ අයිතිවාසිකම් ද ඇතිව "බී" කාණ්ඩයේ සාමාජිකයකු ලෙස පිළිගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන සහ පවත්වනු ලබන "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගී විය යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඈ) පාලනයෙහි, ගිණුම් කරණයෙහි, පරිපාලනයෙහි සහ ක්‍රිකට් මෙහෙයුම්හි නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඉ) සෑම විටක දී ම, සාමාජිකයන් සිය දෙනෙකුගෙන් යුතු අවම ලියාපදිංචි සාමාජික සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් යම් සමාලෝචනයක් හෝ සත්‍යායතනයක් සිදු කරනු ලැබූ විට මේ නියමයට අනුකූලව කටයුතු කර ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඊ) අදාළ සලකා බැලීම සිදුකරන දිනයේ දී "බී" කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගිවන්නකු විය යුතු ය; සහ

(උ) යම් වර්ෂයක් තුළ එකී සාමාජිකයා “බී” කාණ්ඩයේ ක්‍රිකට් තරඟාවලියට සහභාගි වීමට හිමිකම් ලැබීම අවසන් වූ හෝ (ඉ) වන ඡේදයේ දක්වා ඇති අවම සාමාජික සංඛ්‍යාව පිළිබඳ නිර්ණායක සපුරාලීමට අපොහොසත් වූ ඕනෑම අවස්ථාවක, ස්වකීය “බී” කාණ්ඩයේ සාමාජික තත්වය සහ ඡන්දය දීමේ අයිතිවාසිකම් අහිමි වීමට යටත් විය යුතු ය;

එකී ඡන්දය දීමේ අයිතිවාසිකම් හෝ සාමාජික තත්ත්වය අහිමි වීමෙන් පසු එකී සාමාජිකයා සහභාගී වන ක්‍රිකට් ක්‍රීඩා මට්ටමට අනුරූපී අදාළ සාමාජික වර්ගයට අයත් සාමාජිකයකු ලෙස නැවත නිර්දිෂ්ට කිරීම හෝ නැවත වර්ගීකරණය කිරීම කරනු ලැබිය යුතු ය.

(3) “සී” කාණ්ඩයේ සාමාජිකයකු

(අ) අදාළ සලකා බැලීම සිදු කරනු ලබන දිනට ඉක්බිතිව ම නිම කරන ලද අවසන් තරඟ සමයේ ලකුණු සහ ශ්‍රේණිගත කිරීම් අනුව 35 වන වගන්තියේ සඳහන් අදාළ තරඟාවලි ව්‍යුහයට අනුකූලව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන සහ පවත්වනු ලබන ආණ්ඩුකාර කුසලාන තරඟාවලියට සහභාගි වීමට ක්‍රීඩා සමාජයක් හෝ ආයතනයක් සුදුසුකම් ලබන අවස්ථාවක, එකී ක්‍රීඩා සමාජය හෝ ආයතනය ශ්‍රී ලංකා ක්‍රිකට්හි “සී” කාණ්ඩයේ සාමාජිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය යුතු ය; සහ

යම් “සී” කාණ්ඩයේ සාමාජිකයකු:-

(අ) හුදෙක්ම නිරීක්ෂකයන් ලෙස ම පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට්හි මහා සභා රැස්වීම්වලට සහභාගි වීමට අවසර ලැබිය යුතු ය. එකී සාමාජිකයා ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට, යම් ඡන්දය දීමේ ක්‍රියාවලියකට සහභාගි වීමට හෝ අන්‍යාකාරයකින් එහි යම් තීරණ ගැනීමකට, බලපෑම් කිරීමට හෝ ඇතුළත් වීමට හිමිකම් නොලැබිය යුතු ය;

(ආ) අන්තර් පළාත් තරඟාවලියක සිට ආණ්ඩුකාර කුසලාන තරඟාවලිය දක්වා උසස් කරනු ලැබූ යම් සාමාජිකයකු එකී සාමාජිකයා ආණ්ඩුකාර කුසලානයට සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ තරඟ සමයෙන් ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ සිට පමණක් ඊට අදාළ ඡන්දය දීමේ අයිතිවාසිකම් ද ඇතිව "සී" කාණ්ඩයේ සාමාජිකයෙකු ලෙස පිළිගැනීමට හිමිකම් ලැබිය යුතු ය. යම් "සී" කාණ්ඩයේ සාමාජිකයකු:-

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ව්‍යුහගත කරන, සංවිධානය කරන, පවත්වනු ලබන හෝ අනුමත කරනු ලබන ආණ්ඩුකාර කුසලාන තරඟාවලිය සඳහා සහභාගී විය යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඇ) පාලනයෙහි, ගිණුම්කරණයෙහි, පරිපාලනයෙහි සහ ක්‍රිකට් මෙහෙයුමෙහි නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඉ) සෑම විටකදී ම සාමාජිකයන් පනස් දෙනකුගෙන් යුත් අවම ලියාපදිංචි සාමාජික සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් යම් සමාලෝචනයක් හෝ සත්‍යායතනයන් කරනු ලැබූ විට, මේ නියමයට අනුකූලව කටයුතු කර ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය; සහ

(ඊ) යම් වර්ෂයක් තුළදී එකී සාමාජිකයා ආණ්ඩුකාර

| | | |
|---|---|---|
| | | කුසලාන තරඟාවලියට සහභාගි වීමට හිමිකම් ලැබීම අවසන් වූ හෝ මෙහි (ඉ) වන ඡේදයෙන් නියම කරන ලද අවම සාමාජික සංඛ්‍යාව පිළිබඳව නිර්ණායක සපුරාලීමට අපොහොසත් වූ ඕනෑම අවස්ථාවක, ස්වකීය "සී" කාණ්ඩයේ සාමාජිකත්වය අහිමිවීමට යටත් විය යුතු ය.<br><br>එකී සාමාජික තත්වය අහිමිවීමෙන් පසු, එකී සාමාජිකයා සාමාන්‍ය සාමාජිකයකු ලෙස නැවත නිර්දිෂ්ට කිරීම හෝ නැවත වර්ගීකරණය කිරීම කරනු ලැබිය යුතු ය. |
| (4) පළාත් ක්‍රිකට් සංගමයක් | ශ්‍රී ලංකාවේ අදාළ පළාත් තුළ ක්‍රිකට් පරිපාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද යථා පරිදි පිළිගත් පළාත් ක්‍රිකට් සංගම් | එක් එක් පළාත් ක්‍රිකට් සංගමය:-<br><br>(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින ශ්‍රී ලංකාවේ පවතින්නා වූ භූගෝලීය කොට්ඨාස පදනම් කරගත් එකී පළාත තුළට වැටෙන දිස්ත්‍රික්කවලින් සමන්විත විය යුතු ය:<br><br>එසේ වුව ද, එක් එක් පළාත සඳහා පළාත් ක්‍රිකට් සංගමයක් ලියාපදිංචි කරනු ලබන තෙක්, පළාත් ක්‍රිකට් සංගමයකට එකී පළාතෙන් පිටත දිස්ත්‍රික්ක ද ඇතුළත් විය හැකි ය;<br><br>(ආ) අදාළ පළාතේ අදාළ දිස්ත්‍රික් ක්‍රිකට් සංගම්වලින් පමණක් සමන්විත විය යුතු ය; |

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් විධාන කරනු ලැබිය හැකි ස්වකීය පළාත තුළ ක්‍රිකට් කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු ය;

(ඈ) පළාත් මට්ටමින් සහ බිම් මට්ටමින් ක්‍රිකට් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඉ) මේ පනතේ විධිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඊ) කලින් කල, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නියම කළ හැකි යම් වාර්තා, ගිණුම්, සංඛ්‍යා ලේඛන සහ වෙනත් තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(උ) අදාළ වන පරිදි, මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට යටත්ව ශ්‍රී ලංකා ක්‍රිකට්හි යම් මහා සභා රැස්වීමක දී එක් ඡන්දයක් ලබා දීමට හිමිකම් ලැබිය යුතු ය.

(5) සාමාන්‍ය සාමාජිකයකු — යම් තරඟ සමයක් අවසානයේ දී ‘‘ඒ’’ කාණ්ඩයේ සාමාජිකයකු, ‘‘බී’’ කාණ්ඩයේ සාමාජිකයකු හෝ ‘‘සී’’ කාණ්ඩයේ සාමාජිකයකු යන සාමාජික වර්ගවලට අයත් නොවන යම් සාමාජිකයෙකු සාමාන්‍ය සාමාජිකයකු ලෙස වර්ගීකරණය කරනු ලැබිය යුතු ය. සැක දුරු කිරීම සඳහා, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සාමාන්‍ය සාමාජිකයන් විය යුතු ය.

(6) කාන්තා ක්‍රිකට් සංගම් — මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව එකී කාන්තා ක්‍රිකට් සංගමය විසින් බඳවා ගනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත යම් කාන්තා ක්‍රිකට් සංගමයක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත තිබිය යුතු ය.